# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## 2012 වසර




ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2012 වසර

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

**තැ.පෙ. 14, පේරාදෙණිය**

# අන්තර්ගතය



| | | | |
|---|---|---|---|
| 1. | කාර්ය සාධන පැතිකඩ | පිටුව | 01 |
| 2. | හැඳින්වීම | පිටුව | 05 |
| 3. | කාර්ය මණ්ඩල තොරතුරු | පිටුව | 08 |
| 4. | සාධන මට්ටම | පිටුව | 10 |
| 5. | දෙපාර්තමේන්තුව යටතේ ඇති උද්භිද උද්‍යාන සහ ඒකක | පිටුව | 18 |
| 6. | ලෝකයේ හොඳම නිවර්තන කලාපීය උද්භිද උද්‍යානය වීම කරා | පිටුව | 31 |
| 6.1. | ශාක විතැන් සංරක්ෂණය | පිටුව | 31 |
| 6.2. | මල් වගා සංවර්ධනය | පිටුව | 41 |
| 6.3. | අධ්‍යාපනය සහ පුහුණුව | පිටුව | 54 |
| 6.4. | උද්‍යාන පහසුකම් දියුණු කරමින් සංචාරක ප්‍රවර්ධනය | පිටුව | 55 |
| 7. | විශේෂ අවස්ථා | පිටුව | 59 |
| 8. | දෙපාර්තමේන්තුව මඟින් සපයන උපදේශක සේවාවන් | පිටුව | 63 |
| 9. | සෙසු ඒකක/වැඩසටහන්වල සංවර්ධන ක්‍රියාකාරකම් | පිටුව | 65 |
| 9.1. | අතිගරු ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ නිළ නිවාස උද්‍යාන | පිටුව | 65 |
| 9.2. | පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සෙහොන් ඒකකය | පිටුව | 66 |
| 9.3. | උද්භිද උද්‍යාන භාරකාර අරමුදල | පිටුව | 67 |
| 9.4. | මීගලෑව හරිත පියස | පිටුව | 68 |
| 10. | පුස්තකාල පහසුකම් දියුණු කිරීම | පිටුව | 69 |
| 11. | නිලධාරීන් මාරුවීම, විශ්‍රාම යාම, උසස් වීම් සහ පුහුණු | පිටුව | 71 |
| 12. | ප්‍රකාශනයට පත් කළ පර්යේෂණ පත්‍ර | පිටුව | 73 |
| 13. | 2013 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලස්ම | පිටුව | 75 |

# කාර්ය සාධන පැතිකඩ

**1**


## 1.1 2012 වර්ෂයේ ලැබූ ආදායම

- මෙම අවුරුද්දේ දී ඇතුළුවීමේ ගාස්තු, පැළ අලෙවිය සහ අනෙකුත් විවිධ ආදායම මාර්ග මගින් ලැබුණු මුළු ආදායම රුපියල් මිලියන 382.8 වේ. එය පසුගිය අවුරුද්ද හා සසඳා බලන විට (රුපියල් මිලියන 353.4) ආදායම 8% කින් වැඩිවීමක් වේ .




## 1.2 නරඹන්නන්ගේ තොරතුරු

- මෙම අවුරුද්දේ උද්‍යාන නැරඹූ පුද්ගලයින් සංඛ්‍යාව මිලියන 2 කට වඩා (2,191,459) වැඩිවිය. පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී මේ වර්ෂයේදී උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණි විදේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව (259,545) 10% වැඩිවීමක් පෙන්නුම් කරයි. (236,736)



### 1.3 2012 වර්ෂයේ මුළු වියදම

- අවුරුද්ද මුලදී සැලසුම් කල පරිදි ප්‍රධාන උද්‍යාන තුනෙහි සහ අනෙකුත් ඒකකවල සංවර්ධන කටයුතු සිදු කළ අතර, මූල්‍යමය ප්‍රගතියෙන් 98% ක් නිම විය.

| විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය (රු.මි.ලි.) | මුළු වියදම (රු.මි.ලි.) | වැය ප්‍රතිශතය |
|---|---|---|---|
| ප්‍රාග්ධන වැය | 327.8 | 311.5 | **95%** |
| පුනරාවර්තන වැය | 174.8 | 174.3 | **100%** |

### 1.4 විද්‍යාත්මක ක්‍රියාකාරකම්

- විද්‍යාත්මක ක්‍රියාකාරකම් සැලසුම් කළ පරිදි ව්‍යාප්ත කල අතර, මල් වගා සංවර්ධනය, පැළෑටි වර්ගීකරණය සහ වර්ගීකරණ විද්‍යාව ආශ්‍රිත වැඩසටහන් ද පවත්වාගෙන යන ලදි. විවිධ මහජන කණ්ඩායම් සඳහා පුහුණු වැඩසටහන්, පැළෑටි ගවේෂණය සහ පැල සිටුවීමේ වැඩසටහන් ද පවත්වන ලදි.

| | |
|---|---|
| පවත්වාගෙන ගිය පර්යේෂණ වැඩසටහන් (මල්වගා වර්ගීකරණය ආදි) | 14 |
| ප්‍රකාශයට පත් කළ පර්යේෂණ | 14 |
| උද්‍යානවල පැවැත්වූ පුහුණු වැඩසටහන් යටතේ පුහුණුවූ සංඛ්‍යාව | |
| ජෛව විවිධත්ව සංරක්ෂණය | 523 |
| පැළෑටි සංරක්ෂණය | 1,500 |
| මල් වගාව | 10,578 |
| භූමි අලංකරණය | 1,232 |
| පැළෑටි වර්ගීකරණය සහ ශාකාගාර කළමනාකරණය | 698 |
| ත්‍රෛයිමාසික ඩිප්ලෝමා | 76 |
| උද්‍යානයේ පැළෑටි නිෂ්පාදනය | 398,566 |
| පැළෑටි අලෙවිය | 202,416 |
| ක්ෂේත්‍ර ගවේෂණ ප්‍රමාණය | 18 |
| උද්‍යානයේ රුක්උයන සඳහා එකතු කරන ලද නව ශාක | 443 |
| අනෙකුත් වැඩසටහන් | |
| ජාතික රතු දත්ත ව්‍යාපෘතිය | පරිසර අමාත්‍යාංශයේ දායකත්වය ඇතිව ක්‍රියාත්මක කල ශ්‍රී ලංකාවේ වඳවීමේ තර්ජනයට ලක්වූ ශාක පිළිබඳ රතු දත්ත නාමාවලියේ පොත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලදී. |
| ජාත්‍යන්තර වැඩමුළු | ඇමෙරිකා එක්සත් ජනපදයේ යේල් විශ්ව විද්‍යාලයේ සහයෝගීත්වයෙන් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේදී දකුණු ආසියාතික කලාපය තුළ මානව ක්‍රියාකාරකම් බහුල වනාන්තර පුනරුත්ථාපනය පිළිබඳ අන්තර් ජාතික සම්මන්ත්‍රණය පවත්වන ලදී. |
| ජාතික වැඩමුළු | තලස ශාක විවිධත්වය පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රථම ජාතික වැඩමුළුව පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේදී පවත්වන ලදී. |

| | |
|---|---|
| උද්භිද විද්‍යාත්මක සමීක්ෂණය | පැළැටි ගවේෂණය හා පැළැටි නිදර්ශක එකතු කිරීම සඳහා සමීක්ෂණයක් පවත්වන ලදී. වියළි කලාපීය සහ තෙත් කලාපීය තර්ජනයට ලක් වූ ශාක පිළිබඳව මෙහිදී ප්‍රධාන වශයෙන් සැලකිලිමත් විය. |
| ජාතික මල්වගා සමුළුව | කෘෂිකාර්මික පර්යේෂණ සහ ප්‍රතිපත්ති කවුන්සිලයේ (CARP) සහයෝගිත්වය යටතේ පස්වැනි ජාතික මල්වගා පර්යේෂණ සමුළුව (NasFLOR) 2012 වර්ෂයේ දෙසැම්බර් 17 වැනි දින පවත්වන ලදී. |

# හැඳින්වීම

2

## 2.1 පසුබිම

ශ්‍රී ලංකාවේ සියළු ජාතික උද්භිද උද්‍යාන, උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පිහිටා ඇති ජාතික ශාකාගාරය, පැළෑටි වර්ගීකරණ හා අනෙකුත් උද්භිද විද්‍යාවේ විද්‍යාත්මක පර්යේෂණ වැඩසටහන් වල නිරතවේ. මෙම දෙපාර්තමේන්තුව මඟින් මල් වගා පර්යේෂණ සිදු කිරීම මෙන්ම දිවයින තුළ මල් වගා ප්‍රවර්ධනයටත් සහායවීම හා මල්වගා ක්ෂේත්‍රයේ වගාකරුවන් දිරිගැන්වීමටත් විවිධ මාධ්‍ය / ක්‍රියාකාරකම් හා වැඩසටහන් හරහා මල් වගා ක්ෂේත්‍රයේ සංවර්ධනය ඇති කිරීමටත් අවධානය යොමු කරයි. එමෙන්ම විද්‍යාත්මක පර්යේෂණ, ශාක සංරක්ෂණය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශව සඳහා අධ්‍යාපන කටයුතු වෙනුවෙන් පහසුකම් සලසමින් නිසසල බව, නිදහස සොයා උද්‍යානය නැරඹීමට පැමිණෙන පුද්ගලයින්හට පහසුකම් ද සලසනු ලැබේ.

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, හක්ගල උද්භිද උද්‍යානය, ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 19 වන ශතවර්ෂයේදී බ්‍රිතාන්‍යයන් විසින් ස්ථාපිත කරන ලද අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික හා පාරිසරික සංවර්ධනය උදෙසා සියළුම ආකාරයේ ශාක වර්ග හඳුන්වාදීම සම්බන්ධයෙන් වගකීම් දරන ලදි. එම කාලපරිච්ඡේදයේ සිදු කරන ලද කාර්යයන්හි ප්‍රතිඵල ලෙස ආර්ථිකමය හා වැවිලි බෝග වගාවන්හි සංවර්ධනයක් ඇති වූ අතර, 1887 දි වන සම්පත් දෙපාර්තමේන්තුව සහ 1912 දි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැනි වැදගත් රාජ්‍ය ආයතන මෙන්ම තේ, රබර් වැනි වැවිලි වගා සංවර්ධනය සඳහා ආයතන ද බිහිවිය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසු උද්භිද උද්‍යාන එහි අංශයක් ලෙස ක්‍රියාත්මක විය. 2006 වසරේදී ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පිහිටුවන ලද අතර, සියළු ජාතික උද්භිද උද්‍යානවල කළමනාකාරිත්වය පවරාගන්නා ලදි. 2012 වසර වන විට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

වර්තමානය වන විට ශාක අධ්‍යයනය කිරීම සඳහා මෙන්ම ශාක එකතුන් සම්බන්ධයෙන් හා විශේෂයෙන් දකුණු ආසියානු කලාපයට ආවේණික ශාක වල විශිෂ්ට එකතුවක් සහිත මධ්‍යස්ථානයක් ලෙස ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් මෙම උද්භිද උද්‍යාන පිළිගෙන ඇත. ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන ලෝකය පුරා සුප්‍රසිද්ධ උද්‍යාන වශයෙනුත් සෑම වර්ෂයකම නරඹන්නන් මිලියන 1.9 ක් විසින් නරඹනු ලැබේ.

1950 වසරේදි පිහිටුවනු ලැබූ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය ශ්‍රී ලංකාවේ ඖෂධ පැළෑටි ප්‍රවර්ධනය, සංරක්ෂණය, තිරසාර භාවිතය හා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි. මල්/ඖෂධ කර්මාන්තය හා පාරිසරික සංචාරක කර්මාන්තය සංවර්ධනය කරමින් රටේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වීමට වියළි හා ශුෂ්ක කලාපීය ශාක වල විතැන් සංරක්ෂණ කටයුතු සිදුකිරීමේ අභිප්‍රායෙන් වසර 130 කට පසු මෙරට විශේෂඥයන් විසින් නිර්මිත පළමු උද්‍යානය වන හම්බන්තොට මිරිජ්ජවිල උද්භිද උද්‍යානය පිහිටුවන ලද අතර, තෙත් කලාපීය ශාකවල විතැන් සංරක්ෂණ කටයුතු සඳහා අවිස්සාවේල්ල උද්භිද උද්‍යානය ද සැකසෙමින් පවති.

**2.2. දැක්ම**

ශ්‍රී ලංකාවේ විතැන් සංරක්ෂණයේ ප්‍රධාන මධ්‍යස්ථානය වෙමින් දේශිය ආර්ථිකය ප්‍රවර්ධනය උදෙසා උපරිම දායකත්වයක් ලබාදෙන අතර, උද්භිද විද්‍යාත්මකව හා සෞන්දර්යාත්මකව වර්ෂ 2016 වන විට ලෝකයේ හොඳම නිවර්තන කලාපීය උද්භිද උද්‍යානය බවට පත්වීම.

**2.3 මෙහෙවර**

ජනතාව උදෙසා ශ්‍රී ලංකාවේ ස්වාභාවික සහ නිර්මිත පරිසරයන්හි ඇති ශාක සම්පත් අධ්‍යයනය , තිරසාර සංරක්ෂණය සහ ආශ්වාදය සඳහා අවස්ථාව ලබාදිම.

**2.4 ප්‍රධාන කාර්යයන්**

- ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමට විතැන් සරංක්ෂණ ක්‍රම වේද ක්‍රියාවට නැංවිම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
- අධ්‍යාපන සහ සන්නිවේදන ක්‍රම උපයෝගි කර ගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත් පිළිබඳව හා ශාක සම්පත් බැඳි පවත්නා විවිධ වූ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නාවූ නිවැරදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබාදීමට වැඩසටහන් ක්‍රියාවට නැංවිම.
- ශ්‍රී ලංකාවේ මල් වගා කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ විවිධ පර්යේෂණ සහ තාක්ෂණ ක්‍රමවේද අත්හදා බැලීම සහ ක්‍රියාවට නැංවිම.
- ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වාගෙන යාම.
- සුදුසු ස්ථානවල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍යවන්නාවූ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැංවිම.
- උද්‍යාන අලංකරණ විද්‍යාව ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සහ තාක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවිම.
- ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමෙන් යුතු වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සඳහා තාක්ෂණික උපදෙස් ලබා දීම.
- අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ සෞඛ්‍ය ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම .

**2.5. ආයතන හා ඒකක**

1. රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය
2. හක්ගල උද්භිද උද්‍යානය, හක්ගල
3. හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය , ගම්පහ
4. ජාතික ශාකාගාරය, පේරාදෙණිය
5. වන ඖෂධ උද්‍යානය, ගනේවත්ත
6. වියළි කලාපීය උද්භිද උද්‍යානය, මිරිජ්ජවිල, හම්බන්තොට (සංවර්ධනය වෙමින් පවතී)
7. සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය, ඉලුක්ඕවිට, අවිස්සාවේල්ල (සංවර්ධනය වෙමින් පවතී)
8. මල් වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය, පේරාදෙණිය
9. අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය
10. ජනාධිපති මැඳුර උද්‍යානය, කොළඹ
11. ජනාධිපති මැඳුර උද්‍යානය, මහනුවර
12. ජනාධිපති මැඳුර උද්‍යානය, නුවරඑළිය
13. ජනාධිපති මැඳුර උද්‍යානය, අනුරාධපුරය
14. අරලිය ගහ මැඳුර උද්‍යානය, කොළඹ
15. අග්‍රාමාත්‍ය කාර්යාලීය උද්‍යානය, කොළඹ
16. අග්‍රාමාත්‍ය නිළ නිවාස උද්‍යානය, නුවරඑළිය
17. අග්‍රාමාත්‍ය නිළ නිවාස උද්‍යානය, විසුම්පාය
18. සහකාර අධ්‍යක්ෂ කාර්යාලය, කොළඹ
19. උද්‍යාන සහායක කාර්යාලය, නාරාහේන්පිට
20. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකකය, පිටකන්ද, මහනුවර
21. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකකය , බොරැල්ල
22. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකකය, ජාවත්ත

3

# කාර්ය මණ්ඩල තොරතුරු

අනුමත සේවක සංඛ්‍යාව : 700

වත්මන් සේවක සංඛ්‍යාව : 661

වත්මන් සේවක සංඛ්‍යාව 661 න් , 545 ස්ථිර වන අතර, මාණ්ඩලික නිලධාරින් 21, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරින් 34, කෘෂි මෙහෙයුම් උපාධිධාරි නිලධාරින් 3, උපාධිධාරි වැඩසටහන් සහකාර නිලධාරින් 22 සහ කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින් 42 සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් උද්‍යාන කම්කරුවන් 105 දෙනෙකු අයත් වේ. 2007 වර්ෂයේදී කැබිනට් තීරණයකට අනුගාමීව නිලධාරීන් 11 ක් සමෘද්ධි අධිකාරියෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත මාරු කරන ලදී.

## 3.1 සේවක ආකෘතිය

| කාණ්ඩය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 16 |
| තෘතිය මට්ටම | 6 | 5 |
| ද්විතිය මට්ටම | 145 | 101 |
| ප්‍රාථමික මට්ටම | 516 | 423 |
| සමෘද්ධි නිලධාරින් | - | 11 |
| කොන්ත්‍රාත් පදනම මත | - | 105 |
| එකතුව | **700** | **661** |

## 3.2. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය - ප්‍රධාන කාර්යාලය

| තනතුර | නිලධාරියාගේ නම |
|---|---|
| **අධ්‍යක්ෂ ජනරාල්** | ආචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර මයා |
| **අධ්‍යක්ෂ (සංවර්ධන)** | ඩී.එච්.පී. පෙරමුණුගම මයා |
| **අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ ප්‍රචාරණ)** | කේ.එන්.යාපා මයා |
| **අධ්‍යක්ෂ (පාලන)** | අයි.ඩබ්.එම්.සී.කේ. ඉලංගකෝන් මිය |
| **ප්‍රධාන ගණකාධිකාරි** | ඊ.එල්. ජයවර්ධන මයා |
| **සිවිල් ඉංජිනේරු** | වී.ඒ. බණ්ඩාර මයා |


4

# කාර්ය සාධනය

**4.1. නරඹන්නන්ගේ තොරතුරු**

පේරාදෙණිය, හක්ගල සහ ගම්පහ උද්භිද උද්‍යාන නඩත්තුව ඉහල මට්ටමකින් පවත්වාගෙන ගිය අතර, මෙම වර්ෂයේ නරඹන්නන් 2,191,486 ක් (දේශිය සංචාරකයින් 1,931,914 සහ විදේශිය සංචාරකයින් 259,572) උද්භිද උද්‍යාන සඳහා මෙම වසරේදී පැමිණ ඇති අතර, සංසන්දනය කර බලන විට පෙර වසරට වඩා වැඩිවීමක් ඇත (2,098,985). 2012 වර්ෂයේදී (259,572) උද්භිද උද්‍යානයට පැමිණි විදේශිය නරඹන්නන්ගේ සංඛ්‍යාව පෙර වසරට වඩා 10 % වැඩි වී ඇත (236,763) . උද්‍යානයට පැමිණි නරඹන්නන්ගේ සංඛ්‍යාව පහත වගුවේ ලැයිස්තු ගත කර ඇත.


| නරඹන්නන් කාණ්ඩය | පේරාදෙණිය | හක්ගල | ගම්පහ | එකතුව |
|---|---|---|---|---|
| **දේශිය වැඩිහිටි** | 868,663 | 411334 | 177204 | 1,457,201 |
| **දේශිය ළමුන්** | 272,640 | 168295 | 16439 | 457,374 |
| **ජ්‍යෙෂ්ඨ පුරවැසියන්** | 8,155 | 8114 | 1070 | 17,339 |
| එකතුව (දේශිය නරඹන්නන්) | 1,149,458 | 587743 | 194713 | 1,931,914 |
| **විදේශිය වැඩිහිටි** | 234,316 | 11318 | 240 | 245,874 |
| **විදේශිය ළමුන්** | 8,991 | 806 | 3 | 9,800 |
| **විදේශිය ශිෂ්‍ය** | 3,506 | 392 | | 3,898 |
| එකතුව (විදේශිය නරඹන්නන්) | 246,813 | 12,516 | 243 | 259,572 |
| නරඹන්නන්ගේ මුළු එකතුව | **1,396,271** | **600,259** | **194,956** | **2,191,486** |




**4.2.** ආදායම

ඇතුළුවීමේ ගාස්තු, පැළ අලෙවිය සහ අනෙකුත් ආදායම්වලින් රුපියල් මිලියන 382.8 මුදලක් මුළු ආදායම වශයෙන් උපයන ලදී. එය පෙර වසරේ ඉපැයූ (රුපියල් මිලියන 353.4) ආදායම හා සංසන්දනය කිරීමේදී 8% වැඩිවීමකි. උද්‍යාන සඳහා නරඹන්නන්ගෙන් පමණක් ඉපැයූ ආදායම රුපියල් මිලියන 356.6 ක් වන අතර, අනෙකුත් මූලාශ්‍ර (පැළ අලෙවිය , කුලියට දීම්, වෙනත් ) වලින් ඉපැයූ ආදායම රුපියල් මිලියන 26.2 කි.


| ඒකකය | මුළු ආදායම (රු.) |
|---|---|
| රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය | 326,220,159.53 |
| උද්භිද උද්‍යානය, හක්ගල | 40,112,442.40 |
| උද්භිද උද්‍යානය, ගම්පහ | 14,716,622.00 |
| වන ඖෂධ උද්‍යානය, ගනේවත්ත | 583,552.00 |
| වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට | 294,060.00 |
| “සුවහස් මල් සෙවන පැළ තවාන” පැළ තවාන, බත්තරමුල්ල | 58,310.00 |
| තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 809,400.00 |
| **මුළු එකතුව** | **382,794,545.93** |




**4.3.** **ජාතික උද්භිද උද්‍යානවල නිෂ්පාදනය කරන ලද පැළවලින් විකුණන ලද පැළ ගණන සහ ඉන් ලබාගත් ආදායම**




**4.4.** **දෙපාර්තමේන්තුව ඉපැයූ මුළු ආදායම ප්‍රතිශත වශයෙන්**




**4.5. ආදායම සහ වියදම**




ඉහත ප්‍රස්තාරයේ පෙන්වන පරිදි ආදායමේ ඉහල යාමක් මෙන්ම දෙපාර්තමේන්තුවේ (Profit Margin) ලාභ ආන්තිකයක් ඇත.

**4.6. දෙපාර්තමේන්තුවේ ලාභ ආන්තිකයේ 2005 සිට 2012 වර්ෂය දක්වා වෙනස්වීම (ප්‍රාග්ධන වැය රහිතව)**



**4.7.** රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ තොරතුරු

අංකය: **32201**

| | වැය (රුපියල්) උපරිම සීමාව | අය (රුපියල්) අවම සීමාව | හර ශේෂය (රුපියල්) උපරිම සීමාව |
|---|---|---|---|
| අයවැය ඇස්තමේන්තුව - **2012** | **20,000,000.00** | **8,500,000.00** | **60,000,000.00** |
| ප්‍රතිශෝධිත සීමාව | - | - | - |
| සත්‍ය දත්ත | **14,320,346.00** | **12,652,989.00** | **47,709,865.00** |

**4.8.** වැය

**4.8.1** ප්‍රාග්ධන වැය

| උප ව්‍යාපෘති | වැය විෂය | අයිතමය විස්තර | **2012** වර්ෂයේ අය-වැයෙහි ශුද්ධ ප්‍රතිපාදනය රු. | මුළු වැය රු. | ඉතිරි ප්‍රතිපාදන රු. | වැය % |
|---|---|---|---|---|---|---|
| | | <u>**මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම**</u> | | | | |
| 0 | 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,820,000.00 | 1,393,343.00 | 426,657.00 | 77% |
| 0 | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 273,000.00 | 270,228.00 | 2,772.00 | 99% |
| 0 | 2003 | වාහන | 455,000.00 | 317,435.00 | 137,565.00 | 70% |
| | | <u>**ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම**</u> | | | | |
| 0 | 2101 | වාහන | 0 | 0 | 0.00 | |
| 0 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 455,000.00 | 436,370.00 | 18,630.00 | 96% |
| 0 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 318,000.00 | 276,168.00 | 41,832.00 | 87% |
| 0 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 910,000.00 | 199,472.00 | 710,528.00 | 22% |
| 0 | 2105 | ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරිම | 1,365,000.00 | 1,340,401.00 | 24,599.00 | 98% |
| | | <u>**ප්‍රාග්ධන මාරු කිරීම්**</u> | | | | |
| 0 | 2201 | උද්භිද උද්‍යාන භාරකාර අරමුදල | 81,900,000.00 | 81,900,000.00 | 0.00 | 100% |
| 0 | 2401 | පුහුණුව සහ ගොඩනැගීමේ ධාරිතාවය | 91,000.00 | 82,359.00 | 8,641.00 | 91% |

| උප ව්‍යාපෘති | වැය විෂය | අයිතමය විස්තර | 2012 වර්ෂයේ අය-වැයෙහි ශුද්ධ ප්‍රතිපාදනය රු. | මුළු වැය රු. | ඉතිරි ප්‍රතිපාදන රු. | වැය % |
|---|---|---|---|---|---|---|
| | | **විශේෂ ව්‍යාපෘති** | | | | |
| 1 | 2105 | ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සහ ගම්පහ උද්‍යානය සංවර්ධනය | 27,300,000.00 | 27,094,719.00 | 205,281.00 | 99% |
| 2 | 2105 | මල්වගා සංවර්ධන වැඩසටහන | 35,490,000.00 | 33,674,008.00 | 1,815,992.00 | 95% |
| 3 | 2105 | වියළි කලාපිය උද්භිද උද්‍යානය, හම්බන්තොට | 136,500,000.00 | 126,486,173.00 | 10,013,827.00 | 93% |
| 4 | 2105 | තෙත් කලාපිය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 36,400,000.00 | 35,499,926.00 | 900,074.00 | 98% |
| 6 | 2105 | මල්වගා ප්‍රවර්ධන වැඩසටහන | 4,550,000.00 | 2,492,793.00 | 2,057,207.00 | 55% |
| | | එකතුව | **327,827,000.00** | **311,463,395.00** | **16,363,605.00** | **95%** |

**4.8.2.** පුනාවර්තන වැය

| විෂය මුලක කේතය | විෂය මුලක විස්තරය | 2012 වර්ෂයේහි අය - වැයෙහි ශුද්ධ ප්‍රතිපාදනය (මු.රෙ. 66 පැවරීම්) (රු.) | මුළු වැය (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු.) | වැය % |
|---|---|---|---|---|---|
| | **පුද්ගල පඩිනඩි** | | | | |
| 1001 | වැටුප් සහ වේතන | 87,900,000.00 | 87,821,739.27 | 78,260.73 | 100% |
| 2002 | අතිකාල සහ නිවාඩු සඳහා ගෙවීම | 4,250,000.00 | 4,207,052.86 | 42,947.14 | 99% |
| 1003 | අනෙකුත් දීමනා | 50,315,000.00 | 50,314,127.67 | 872.33 | 100% |
| | **ප්‍රවාහන වියදම්** | | | | |
| 1101 | දේශිය | 1,300,000.00 | 1,284,339.20 | 15,660.80 | 99% |
| 1102 | විදේශිය | 50,000.00 | 46,437.50 | 3,562.50 | 93% |
| | **සැපයුම්** | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 700,000.00 | 695,495.16 | 4,504.84 | 99% |
| 1202 | ඉන්ධන | 2,500,000.00 | 2,468,614.00 | 31,386.00 | 99% |
| 1203 | ආහාර සහ නිළ ඇඳුම් | 165,000.00 | 134,453.00 | 30,547.00 | 81% |
| 1205 | අනෙකුත් දෑ | 3,000,000.00 | 2,986,639.15 | 13,360.85 | 100% |

| විෂය මූලක කේතය | විෂය මූලක විස්තරය | 2012 වර්ෂයේහි අය - වැයෙහි ශුද්ධ ප්‍රතිපාදනය (මු.රෙ. 66 පැවරීම්) (රු.) | මුළු වැය (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු.) | වැය % |
|---|---|---|---|---|---|
| | **නඩත්තු වැය** | | | | |
| 1301 | වාහන | 1,300,000.00 | 1,285,969.90 | 14,030.10 | 99% |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 550,000.00 | 544,533.59 | 5,466.41 | 99% |
| 1303 | ගොඩනැඟිලි සහ ඉදිකිරීම් | 350,000.00 | 331,505.95 | 18,694.05 | 95% |
| | **සේවාවන්** | | | | |
| 1401 | ප්‍රවාහන | 500,000.00 | 488,105.00 | 11,895.00 | 98% |
| 1402 | තැපැල් සහ විදුලි සංදේශ | 1,400,000.00 | 1,324,706.81 | 75,293.19 | 95% |
| 1403 | විදුලිය සහ ජලය | 2,900,000.00 | 2,815,720.78 | 84,279.22 | 97% |
| 1404 | කුළී සහ දේශීය බදු | 320,000.00 | 283,140.81 | 36,859.19 | 88% |
| 1405 | අනෙකුත් සේවාවන් | 16,400,000.00 | 16,330,848.10 | 69,151.90 | 99% |
| | **මාරු කිරීම්** | | | | |
| 1506 | දේපල ණය පොළිය | 980,000.00 | 953,286.98 | 26,713.02 | 97% |
| | **එකතුව** | **174,880,000.00** | **174,316,715.73** | **563,284.27** | **100%** |

5

# දෙපාර්මේන්තුව යටතේ ඇති උද්භිද උද්‍යාන සහ ඒකක

## 5.1. රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය



රාජකීය උද්භිද උද්‍යානය බ්‍රිතාන්‍යයන් විසින් වර්ෂ 1821 දි ස්ථාපිත කරන ලද අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරිසරික සංවර්ධනය උදෙසා සියළුම ආකාරයේ ශාක වර්ග හදුන්වා දීම සම්බන්ධයෙන් වගකීමෙන් කටයුතු කරන ලදී. එම කාලපරිච්ඡේදයේ සිදු කරන ලද කාර්යයන්හි ප්‍රතිඵල වශයෙන් ආර්ථිකමය හා වැවිලි බෝග වගාවන්හි සංවර්ධනයක් ඇති වූ අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ තවත් වැදගත් රාජ්‍ය ආයතන මෙන්ම තේ, රබර් වැනි වගා සංවර්ධන කටයුතු සඳහා ද ආයතන බිහි විය.

අශ්ව ලාඩමක හැඩයට වූ භූමි භාගයක පිහිටා ඇති පේරාදෙණිය රාජකිය උද්භිද උද්‍යානය වටා ශ්‍රී ලංකාවේ දිගම ගංගාව වන මහවැලි ගඟ ගලා බසී. ප්‍රධාන දොරටුව කොළඹ පාරට මුහුණලා ඇති අතර, මහනුවර සිට හැතැක්ම හතරක දුර ප්‍රමානයක පිහිටා තිබේ. මෙහි මුළු වපසරිය අක්කර 147 වන අතර පැළ වර්ග 4,500 වේ. ප්‍රධාන උස මුහුදු මට්ටමේ සිට අඩි 1600 වේ .

මෙම උද්‍යානය තුළ ශ්‍රී ලංකාවට ආවේණික ශාක වර්ග, නිවර්තන කලාපීය ශාක, විසිතුරු පැළෑටි, මල් පිපෙන විශාල ගස් හා ඇතට විහිදෙන තණබිම්, වැල් වර්ග වැනි විවිධ ශාක හා පැළෑටි වර්ග දැකිය හැකිය. උද්‍යානයේ ස්ථාපිත ඕකිඩ් ගෘහය ද නරඹන්නන්ගේ සුවිශේෂි අවධානය යොමුවන ස්ථානයකි. මෙම ගෘහයේ 300 කට අධික වූ විවිධ වර්ගයේ අලංකාර ඕකිඩ් මල්වලින් ගහන වේ. පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ යොදා ගනු ලබන ගස් වර්ග සහ පැළෑටි වර්ග, ඖෂධ උයන තුළ දක්නට ලැබේ. මෙම උද්‍යානය සමීපයෙන් ගලා බස්නා මහවැලි නදිය එම උද්‍යානයේ විචිත්‍රවත් බව තවදුරටත් ඔප් නංවයි.

### 5.1.1. 2012 දෙසැම්බර් 31 දිනට සේවක මණ්ඩල තොරතුරු

| නිලධාරියාගේ නම | තනතුර | සුදුසුකම් | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| ආචාර්ය. ඒ.එම්.ඒ.එස්. අත්තනායක මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | බී.එස්සී. (උද්භිද විද්‍යාව) එම්.එස්.සී. පී.එච්.ඩී. | ශාක විද්‍යාව සහ ශාක වර්ගීකරණය විද්‍යාව |
| පී. ඩී. එස්. විජේරත්න මයා | උද්‍යාන සංරක්ෂක | බී.එස්සී | කෘෂි විද්‍යාව |
| පී.කේ. මහන්තේගම මයා | විදුහල්පති | බී.එස්සී | කෘෂි විද්‍යාව |
| ඒ.ජී. සුනිල් මයා | වැඩසටහන් සහකාර | බී.එස්සී එම්.ෆිල් (දර්ශනපති) | ශාක විද්‍යාව |
| එන්.ඒ.එස්. ජේ.සෙනෙවිරත්න මිය | වැඩසටහන් සහකාර | බී.එස්සී | ජීව විද්‍යාව |
| පී. ආර්. සී. රත්නායක මයා | කෘෂිකර්ම උපදේශක | කෘෂි විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව | භූමි අලංකරණය |
| එච්. ආර්. එස්. එම්. හේරත් මයා | කෘෂිකර්ම උපදේශක | කෘෂි විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව | පැළ තවාන් කළමනාකරණය සහ පැළ නිෂ්පාදනය |
| එස්. එස්. එම්. සමරකෝන් මයා | උද්‍යාන සහායක | භූමි හා උද්‍යාන අලංකරණය පිළිබඳව එක් අවුරුදු පාඨමාලාව | පැළ රැකවරණය සහ නඩත්තුව |
| ඩී. එම්. එස්. ධනසේකර මයා | උද්‍යාන සහායක | භූමි හා උද්‍යාන අලංකරණය පිළිබඳව එක් අවුරුදු පාඨමාලාව | සේවා නඩත්තුව |
| ටී. ආර්. බී. වීරකෝන් මයා | උද්‍යාන සහායක | භූමි හා උද්‍යාන අලංකරණය පිළිබඳව එක් අවුරුදු පාඨමාලාව | භූමි අලංකරණය |
| ටී. ප්‍රේමසිරි මයා | උද්‍යාන සහායක | භූමි හා උද්‍යාන අලංකරණය පිළිබඳව එක් අවුරුදු පාඨමාලාව | කම්කරුවන් බෙදා හැරීම හා අධීක්ෂණය |
| ඒ. ජී. තිලකරත්න මයා | උද්‍යාන සහායක | භූමි හා උද්‍යාන අලංකරණය පිළිබඳව එක් අවුරුදු පාඨමාලාව | ආරක්ෂක සේවාවන්හි අධීක්ෂණය |


ඉහත සඳහන් කාර්ය මණ්ඩලයට අමතරව කළමනාකරණ සහකාර නිලධාරීන් පස් දෙනෙකු , බංගලා භාරකරුවෙකු , උද්‍යාන සුපවයිසර්වරු තිදෙනෙකු , රසායනාගාර සහායකවරයෙකු, ගාස්තු අය කිරීමේ සහකාරවරුන් හත් දෙනෙකු, රියදුරෙකු, බද්ධ කරුවෙකු, ලේබල්කරුවන් දෙදෙනෙකු, තෘණ කපන යන්ත්‍ර ක්‍රියාකරුවන් හය දෙනෙකු, ගබඩාකරුවෙකු, මුරකරුවන් දහනම දෙනෙකු, තවාන්කරුවන් දෙදෙනෙකු, ට්‍රැක්ටර් ක්‍රියාකරුවන් දෙදෙනෙකු, වඩුවැඩකරුවෙකු, පෙදරේරුවන් තිදෙනෙකු, වැද්දුම්කරුවෙකු, කම්මල්කරුවෙකු, ගස් කපන්නන් දෙදෙනෙකු, ගස් හෙලන්නෙකු, ස්ථිර කම්කරුවන් අසූ එක් දෙදෙනෙක් ද සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් කම්කරුවන් නව දෙනෙකු ද ඔවුන්ගේ සේවාවන් උද්‍යානය වෙත ලබාදෙයි.

### 5.1.2. නරඹන්නන්

මෙම වසරේ නරඹන්නන් 1,396,271 ප්‍රමාණයක් (දේශිය නරඹන්නන් 1,149,458 සහ විදේශිය නරඹන්නන් 246,813) උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණ ඇති අතර, පසුගිය වසර හා සංසන්දනය කරන විට උද්භිද උද්‍යානය වෙත පැමිණි විදේශිය නරඹන්නන්ගේ සංඛ්‍යාව 9% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

**5.1.3. ආදායම**

මෙම වසර තුලදී ඇන්තුරියම්, ඕකිඩ්, විසිතුරු පත්‍රිකා ශාක සහ ඖෂධ පැළෑටි 88,857 ද බීජ පැකට් 2,662 ද වියළි මල් , උණ බට පෝච්චි, කුළු බඩු සහ නැවුම් මල් ආශ්‍රිත රෝපණ ද්‍රව්‍යය උද්‍යානයේ පිහිටි අලෙවිසැලේදී විකුණන ලද අතර, රුපියල් මිලියන 326.2 ආදායමක් උපයන ලදී. (පැළ අලෙවියෙන් රුපියල් මිලියන 4, ප්‍රකාශන තුළින් රුපියල් මිලියන 0.3, කුළියට දීම් වලින් රුපියල් මිලියන 9.6 සහ චිත්‍රපට මගින් රුපියල් මිලියන 0.3).




**5.1.4. විශේෂ නියෝජිතයන්ගේ පැමිණීම**

විවිධ රටවල, විවිධ මට්ටම්වල අයත් නියෝජිතයින් උද්‍යානයට පැමිණ උද්‍යානය පවත්වාගෙන යාම සහ උද්‍යානයේ භූමි අලංකරණ ලක්ෂණ පිළිබඳව අගය කර ඇත.

| | නියෝජිතයන් | දිනය | රට |
|---|---|---|---|
| 1. | කෙන්ට් ප්‍රාන්තයේ රාජකීය මයිකල් කුමරා සහ කෙන්ට්හි මයිකල් කුමරිය | 02.01.2012 | එංගලන්තය |
| 2. | අධ්‍යක්ෂ මේජර් මිරොසලව් බෝබෙක් (Miroslav Borbek) සහ ප්‍රාග් (Prague) සත්වෝද්‍යානයේ නිලධාරීන් අටදෙනෙකු | 20.01.2012 | චෙක් (Czech ) ජනරජය |
| 3. | දකුණු ඉන්දියානු හමුදා කොමදෝරු ලුතිනන් ජනරාල් ඒ.කේ.සිං | 10.03.2012 | ඉන්දියාව |
| 4. | චීන රජයේ සෝයංග් (Saoyangh) නගරයේ නගරාධිපති චෙං යොක්සියු මහතා (Chen Youxiu ) සහ සෙසු චීන නියෝජිතයින් | 12.03.2012 | චීනය |
| 5. | බංග්ලාදේශයේ මහජන ජනරජයේ කර්මාන්ත ඇමති දුලිප් බාආ ( Dulip Barua) | 31.03.2012 | බංග්ලාදේශය |
| 6. | ජාතික ආරක්ෂක පාසැලේ නිලධාරීන් 21 | 20.05.2012 | නයිජීරියාව |
| 7. | විදේශ කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති පිළිබඳ ලේකම් අතිගරු අර්ලින්ඩා එෆ්. බැසිලියො මහතා ( Erlinda F. Basilio) | 25.05.2012 | පිලිපීනය |
| 8. | “ ලුම්බිණි ලෝක නගර ප්‍රධාන සැලැස්මෙහි “ සහ ෂම්බුමාලා (Shambhu Malla) ව්‍යාපෘති අධ්‍යක්ෂ මහාචාර්ය ක්වාක් යං හූං (Kwaak Young Hoon) | 30.05.2012 | දකුණු කොරියාව |
| 9. | බොස්ටන්හි මැසාචුසෙට්ස් (Massachusetts) විශ්ව විද්‍යාලයේ ජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය කමල් බාවා මහතා | 17.07.2012 | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 10. | වන කළමනාකරණය පිළිබඳ පර්යේෂණ මහාචාර්ය වන ආර්නෝල්ඩ් රුක් උයනෙහි අධ්‍යක්ෂ | 17.07.2012 | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 11. | ශ්‍රී ලංකාවේ තායිලන්ත තානාපති එච්.ඊ.පී. වොරාචාට් මහතා (H.E. P. Worachat) | 01.08.2012 | තායිලන්තය |
| 12. | පොදු රාජ්‍ය මණ්ඩලීය සම්මේලනයට සහභාගිවූ ඇමතිවරුන් | 04.09.2012 | - |
| 13. | පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාර සම්මේලනයේ සභාපති | 02.10.2012 | ඉන්දියාව |

| | නියෝජිතයන් | දිනය | රට |
|---|---|---|---|
| | ආචාර්ය මොහාන් කෝල් (Dr. Mohan Kaul ) | | |
| 14. | චීන මල් සමාගමේ සභාපති ජියැං සෙගුයි මැතිණිය ( Madam Giang Zehui ) ගේ නායකත්වයෙන් යුතු චීනයේ රාජ්‍ය වන පරිපාලනයේ පුද්ගලයන් එකොලොස් දෙනෙකුගෙන් යුත් නියෝජිත පිරිස | 04.10.2012 | චීනය |
| 15. | කතෝලික බිෂොප්වරුන්ගේ සම්මේලනය සඳහා කතෝලික බිෂොප්වරුන් සියයක් සහභාගි වන ලදී. | 06.10.2012 | - |
| 16. | චීන මහජන ජනරජයේ ව්‍යාපාර සම්මේලනයේ සභාපති එච්.ඊ. සෙහො කිසැං මහතාගේ නිළ සංචාරය | 08.10.2012 | චීනය |
| 17. | ආසියාවේ විද්‍යා පදනම් සම්මේලනය සඳහා විදේශිය නියෝජිතයින් සහභාගි වෙන ලදී. | 10.10.2012 | - |
| 18. | මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ සහයෝගිත්වයෙන් මාලදිවයින දූපත්වල අධ්‍යාපන නිලධාරින් | 04.11.2012 | මාලදිවයින |
| 19. | සිෂෙල්ස් දිවයිනේ පාර්ලිමේන්තු සාමාජිකයින් | 06.11.2012 | සීෂේල්ස් |
| 20. | ඉන්දියාවේ ලාල් බහදූරි ජාතික අධ්‍යාපන ආයතනයට අනුයුක්ත පරිපාලන නිලධාරින් දහහතර දෙනෙකු | 08.11.2012 | ඉන්දියාව |
| 21. | ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු එක්සත් ජනපද තානාපති මයිකල් ජේ. සිසොං මහතා | 29.11.2012 | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 22. | ගන්නෝරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගිත්වයෙන් සාක් රටවල බීජ තාක්ෂණවේදීන් තිස්දෙනෙකු | 10.12.2012 | - |
| 23. | මාලදිවයින අධ්‍යාපන නිලධාරින් දහහතර දෙනෙකු සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරින් දහදෙනෙකු | 12.12.2012 | මාලදිවයින |

### 5.2. ජාතික ශාකාගාරය



ජාතික ශාකාගාරය යනු ශ්‍රී ලංකාවේ ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක් රැස් කර ඇති ස්ථානයකි. විදේශිය වෙනත් බහුල නිදර්ශක සහ වගා කරන ලද නිදර්ශක ක්‍රමානුකූල අධ්‍යයනය සඳහා ආරක්ෂා කර ඇත. සුදුසු තත්ත්ව යටතේ සංරක්ෂණය කළ 160,000 ආසන්න ශාකාගාර නිදර්ශක විමර්ශනය සඳහා තබා ඇත. ශාක හා සම්බන්ධ වු උද්භිද විද්‍යාත්මක පැහැදිලි කිරීමේ නිදර්ශක එකතුවක් සහ 3500 පමණ පොත්, පුවත්පත්, සඟරා සංරක්ෂණය කර ඇත.

ජාතික ශාකාගාරය ශාක ගවේෂණ, නිදර්ශක හඳුනා ගැනීම සහ සැකසීම මෙන්ම තොරතුරු රැස් කිරීම, වර්ග කිරීම සහ ව්‍යාප්තිය ද දේශිය ශාක සම්පත අවශ්‍ය විට සංශෝධනය කිරීම වැනි කටයුතු සඳහා දායකත්වයක් ලබාදෙයි. ජාතික ශාකාගාරය දේශිය සහ විදේශිය පර්යේෂකයින් සඳහා වර්ගීකරණ පර්යේෂණ හා සම්බන්ධ පර්යේෂණ කාර්යයන් සඳහා

පහසුකම් සලසනු ලබයි. එසේම ජාතික ශාක නිරෝධායතනය සහ රේගුව වෙත ශාක සම්බන්ධ නෛතික ගැටළු පැන නැගුණු විට සහ ශාක ද්‍රව්‍යය ආනයනයේදී හා අපනයනයේදී නෛතික ගැටළු පැන නැගුණ විට ශාක හඳුනා ගැනීම සඳහා සේවය ලබාදෙයි. ජාතික ශාකාගාරය සහ ලෝකයේ අනෙකුත් ප්‍රදේශවල පිහිටි පර්යේෂණ ආයතන සමඟ ශාක නිදර්ශක සහ දැනුම හුවමාරු කර ගැනීමේ කර්තවයේ නියැලී සිටියි. මෑතකදී ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳව ජාතික රතු දත්ත නාමාවලිය පිළිබඳ අධිකාරිය වශයෙන් ද ජාතික ශාකාගාරය පිළිගන්නා ලදි.

### 5.2.1. 2012 දෙසැම්බර් 31 වන තෙක් කාර්ය මණ්ඩලයේ තොරතුරු

| නම | තනතුර | සුදුසුකම | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| ආර්.ඒ.එස්.ඩබ්.රණසිංහ මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැඩබලන) | බී.එස්.සී .(උද්භිද විද්‍යා), එම්.එස්.සී. | ශාක වර්ගීකරණ විද්‍යාව සහ බීජ ශාක වර්ගීකරණය සහ ඒකකයේ කළමනාකරණය |
| එන්.පී.ටී. ගුණවර්ධන මිය | කෘෂි මෙහෙයුම් නිලධාරි | බී.එස්.සී .(උද්භිද විද්‍යා), එම්.එස්.සී | බ්‍රයෝශාකිය වර්ගීකරණ විද්‍යාව |
| ජී. ෆොන්සේකා මිය | වැඩසටහන් සහකාර | බී.එස්.සී .(උද්භිද විද්‍යා), එම්.එස්.සී | ශාක වර්ගීකරණ විද්‍යාව සහ බීජ ශාක වර්ගීකරණය |

ඉහත වගුවෙහි සඳහන් කාර්ය මණ්ඩලයට අමතරව කළමනාකරණ සහකාරවරයෙකු සහ ස්ථිර කම්කරුවන් තිදෙනෙකුගේ සේවය ඒකකය වෙත ලබාදෙයි.

### 5.3. මල් වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකය

මල්වගා ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ හා වැඩසටහන් පැවැත්වීම සඳහා මල් වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය පිහිටුවන ලදී. මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා පුහුණු වැඩසටහන් පැවැත්වීම, ක්ෂේත්‍ර උපදේශක සේවා සැපයීම, දිස්ත්‍රික් මට්ටමෙන් මල් වැවීමේ සංවිධාන ස්ථාපිත කිරීම මෙම ක්ෂේත්‍රය සම්බන්ධ ආයෝජන අවස්ථා පිළිබඳව වගාකරුවන් දැනුවත් කිරීම වැනි කටයුතු මෙම ඒකකය මඟින් සිදු කරයි. වගාකරුවන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය උපකරණ හා ගුණාත්මක රෝපණ ද්‍රව්‍යය ලබාදීම තුළින් මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඔවුන් දායක කර ගැනීම ද මෙම ඒකකය මඟින් ඉටුවන මෙහෙවරකි.



ශ්‍රී ලංකාවේ මල් වගා ක්ෂේත්‍රය මෑත අතීතයේ දී ලාභදායි විනිමය ඉපැයීම් ලබාදෙන මාර්ගයක් ලෙස ඉදිරියට පැමිණ ඇත. එහෙයින් ආදායම් උත්පාදනය හා රැකියා සැපයීම සඳහා මෙම ක්ෂේත්‍රය තවදුරටත් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. ඔවුන්ගේ සැබෑ විභවයන් හඳුනා ගනිමින් අස්වනු , පරිසරය, ගම, නගරය හරහා මුළු රටෙහිම තිරසාර සංවර්ධනයට රැකුල් දෙමින් මහා පරිමාණයෙන් මල්වගා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් සඳහා සහයෝගය මල් වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය මඟින් ලබාදෙයි.

**5.3. 1**. **කාර්ය මණ්ඩල තොරතුරු**

**පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ මල් වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය**

| | නම | තනතුර | පලපුරුද්ද | ක්ෂේත්‍රය |
|---|---|---|---|---|
| 1. | ආචාර්ය ශෙලොම් ඒ. ක්‍රිෂ්ණරාජා මෙනවිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (මල්වගා පර්යේෂණ) | බී.එස්.සී. (උද්භිද විද්‍යා) එම්.එස්.සී., පි.එච්. ඩී (දර්ශනසූරි) | ජෛව තාක්ෂණය සහ ඒකකය කළමනාකරණය කිරීම |
| 2. | ඒ. යෝගරාජා මයා | පර්යේෂණ සහකාර | කෘෂිකර්ම ඩිප්ලෝමා | ක්ෂුද්‍ර ප්‍රචාරණය |
| 3. | ආර්.එම්. කමලා මැණිකේ මිය | කෘෂි උපදේශක | කෘෂිකර්ම ඩිප්ලෝමා | ඇන්තූරියම් වගාව |
| 4. | යු.බී. පලිපාන මයා | කෘෂි මෙහෙයුම් නිලධාරි | බී.එස්.සී | ජලජ ශාක සහ ජර්බෙරා වගාව |
| 5. | කේ.ඒ.සී.එන්. සෙනෙවිරත්න මිය | කෘෂි මෙහෙයුම් නිලධාරි | බී.එස්.සී, එම්.එස්.සී | පසු අස්වනු කළමනාකරණය, ජෛව පොහොර |
| 6. | එම්.එම්.කේ.පී. වැලිකුඹුර මයා | කෘෂි උපදේශක | කෘෂිකර්ම ඩිප්ලෝමා | විසිතුරු පත්‍රිකා ශාක |
| 7. | ඩබ්.එම්.ඩී.ඊ.ආර්. අන්ද්‍රාදි මිය | කෘෂි උපදේශක | කෘෂිකර්ම ඩිප්ලෝමා | ඕකිඩ් වගාව |
| 8. | අයි.එච්.සී.එන්. සමන්තිකා මිය | කෘෂි උපදේශක | කෘෂිකර්ම ඩිප්ලෝමා | විදේශ ගත වී සිටි (වැටුප් රහිත නිවාඩු ලබා ඇත) |
| 9. | ආචාර්ය එච්.එම්.ආර්.හේරත් මිය | වැඩසටහන් සහකාර | බී.එස්.සී.,එම්.එස්.සී., පි.එච්. ඩී (දර්ශනසූරි) | ක්ෂුද්‍ර ප්‍රචාරණය |
| 10. | එම්.කේ. රූබසිංහ මිය | වැඩසටහන් සහකාර | බී.එස්.සී. එම්.එස්.සී | ශාක අභිජනනය |
| 11. | ආර්.ඒ.එස්. පෙරේරා මිය | වැඩසටහන් සහකාර | බී.එස්.සී. එම්.එස්.සී | මල්වගා ව්‍යාප්තිය මහනුවර ප්‍රදේශය |
| 12. | ඒ.එන්. අබේකෝන් මිය | වැඩසටහන් සහකාර | බී.එස්.සී. එම්.එස්.සී | ශාක ව්‍යාධි විද්‍යාව |
| 13. | එල්.ඒ.පී, පෙරේරා මිය | වැඩසටහන් සහකාර | බී.එස්.සී. එම්.එස්.සී | ශිෂ්‍ය විද්‍යාව, පසු අස්වනු කළමනාකරණය |
| 14. | එම්. උත්පලවර්ණා මිය | වැඩසටහන් සහකාර | බී.එස්.සී | මල්වගා ව්‍යාප්තිය, කෑගල්ල ප්‍රදේශය |
| 15. | කේ.ඒ.එස්. තිලකරත්න මිය | වැඩසටහන් සහකාර | බී.එස්.සී | මල්වගා ව්‍යාප්තිය, කෑගල්ල ප්‍රදේශය |

### 5.4. සුවහස් මල් සෙවන ඒකකය, නාරාහේන්පිට



දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටා ඇති "සුවහස් මල්" මල් වවන්නන්ගේ සංවිධානවලට අයත් වගාකරුවන්ගේ වෙළඳපොල නිෂ්පාදන අලෙවිය අරමුණු කර ගනිමින් මෙම ඒකකය පිහිටුවා ඇත. මෙම ඒකකය ආරම්භයේදී ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටා තිබූ අතර, වර්තමානයේදී නාරාහේන්පිට පිහිටා ඇත. එහි කැපූ මල් අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනාගාරයක් ද පිහිටා ඇත. ආරම්භයේදී පේරාදෙණිය සහ හක්ගල උද්භිද උද්‍යානවල මල් විකිණීමට අදහස් කරන අතර, පසුව වගාකරුවන්ගේ නිෂ්පාදන සඳහා ද අවස්ථා සලසා දීමට කටයුතු කරනු ඇත.

#### 5.4.1. කාර්ය මණ්ඩල තොරතුරු

| නිලධාරියාගේ නම | තනතුර | සුදුසුකම | කේෂ්ත්‍රය |
|---|---|---|---|
| ආර්.එස්.ඩබ්. ගෝමස් මිය | සහකාර අධ්‍යක්ෂ | බී.එස්සී | කාර්ය භාර නිලධාරි |

ඉහත වගුවේ කාර්ය මණ්ඩලයට අමතරව නිලධාරින් එකලොස් දෙනෙකු සමෘද්ධි අධිකාරියෙන් සුවහස් මල් ඒකකයට ඔවුන්ගේ සේවය ලබාදීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත මාරු කර ඇත.

### 5.5. උද්භිද උද්‍යානය, හක්ගල



හක්ගල උද්භිද උද්‍යානය 1861 වර්ෂයේදී පිහිටුවා ඇති අතර, ශ්‍රී ලංකාවේ සීකෝනා (Cinchona) වගාව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ඇත. මෙම උද්‍යානය දිවයිනේ දෙවන විශාලතම උද්භිද උද්‍යානය වේ.

මෙම උද්භිද උද්‍යානය මුහුදු මට්ටමෙන් මීටර් 1,745 ප්‍රමාණයක උස මට්ටමකින් පිහිටා ඇති අතර, හක්ගල කන්ද පාමුල පිහිටා ඇත. මෙම උද්‍යානය නුවරඑළිය - බදුල්ල මාර්ගයේ නුවරඑළියේ සිට කි.මී. 9.5 දුරින් පිහිටා ඇත.


### 5.5.1. 2012 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා නිලධාරින්ගේ තොරතුරු

| නිලධාරියාගේ නම | තනතුර | පලපුරුද්ද | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| එම්.එම්.ඩී.ජේ. සේනාරත්න මයා | උද්‍යාන පාලක | බී.එස්සී. (උද්භිද විද්‍යාව), එම්.එස්සී. (වන විද්‍යාව) | ශාක විද්‍යාව |
| ආර්.ජී.එස්.පී. පියසේන මයා | වැඩසටහන් සහකාර | බී.එස්සී. | මල්වගා |
| ඒ. බී. මැද්දේගොඩ මයා | උද්‍යාන සහායක | එක් අවුරුදු උද්‍යාන සහ භූමි අලංකරණ පාඨමාලාව | උද්‍යාන සහ භූමි අලංකරණය |

ඉහත වගුවේ සඳහන් කාර්ය මණ්ඩලයට අමතරව කළමනාකරණ සහකාර නිලධාරින් තිදෙනෙකු ද, බංගලා භාරකරු දෙදෙනෙකු ද, උද්‍යාන පරීක්ෂකවරු තිදෙනෙකු ද රසායනාගාර සහායෙකු ද, ගාස්තු අය කිරීමේ සහකාරවරයෙකු, රියදුරෙකු ද, බද්ධකරුවෙකු ද, ලේබල් ලියන්නෙකු ද, තෘණ කපන යන්ත්‍ර ක්‍රියාකරුවන් දෙදෙනෙකු ද, ගබඩාභාරකුවෙකු ද මුරකරුවෙකු ද, පැළ තවාන්කරුවෙකු ද , ස්ථිර කම්කරුවන් හතලිස් පස් දෙනෙකු සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් කම්කරුවන් පස් දෙනෙකු ද ඔවුන්ගේ සේවය උද්‍යානය වෙත ලබාදෙයි.

### 5.5.2. නරඹන්නන්

පුද්ගලයින් 600, 232 ක් (දේශිය නරඹන්නන් 587,743 සහ විදේශිය නරඹන්නන් 12,489) 2012 වර්ෂයේදී උද්භිද උද්‍යාන නරඹා ඇති අතර, එය පසුගිය වසර හා සංසන්දනය කරන විට (510,116) 18% වැඩිවීමකි.




### 5.5.3. ආදායම

මෙම වසරේදී උද්‍යානයේ අලෙවි සැලෙන් පැළ, 73,238 ක් බීජ පැකට් 6,680 ක් සහ කැපූ මල් 33,926 ක් විකුණන ලදී. මෝටර් රථ 4,913 ක් ද, යතුරු පැදි 932 ක් ද පා පැදි 25 ක් ද උද්‍යානය තුළට ඇතුළුවීම් මගින් ආදායම් උපදවා ඇත.

| කාණ්ඩය | ආදායම (රු.) |
|---|---|
| ප්‍රවේශපත්‍ර ගාස්තු | 35,525,015.00 |
| වාහන ඇතුලත් කිරීමේ ගාස්තු | 807,475.00 |
| පැළෑටි සහ අනෙකුත් ආශ්‍රිත අලෙවිය | 3,200,949.90 |
| ප්‍රකාශන අලෙවිය | 15,890.00 |
| සංචාරක බංගලාව වෙන් කිරීම | 341,547.00 |
| චිත්‍රපට සහ අනෙකුත් ක්‍රියාකාරකම් | 221,565.50 |
| **එකතුව** | **40,112,442.40** |



පැළ තවාන්වල වැඩුණු ජර්බෙරා ශාක

**5.5.4. විශේෂ නියෝජිතයන්ගේ පැමිණීම**

20.04.2012 දින පාකිස්තාන හමුදා නිලධාරින් සහ විවිධ රටවලින් නියෝජිතයින් පහලොස් දෙනෙකු උද්‍යානය නැරඹීමට පැමිණ ඇත.

පුරාණ තේ වගාව පිළිබඳ අධ්‍යනයක් සඳහා 21.07.12 දින මහාචාර්ය පීටර් ඇෂ්ටන් (හාවර්ඩ් විශ්ව විද්‍යාලය), මහාචාර්ය මාක් ඇෂ්ටන් (යේල් විශ්ව විද්‍යාලය) සමඟ මහාචාර්ය නිමල් ගුණතිලක (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) සහ මහාචාර්ය සාවිත්‍රී ගුණතිලක උද්‍යානයට පැමිණෙන ලදී.

**5.6. ගම්පහ උද්භිද උද්‍යානය**



ශ්‍රී ලංකාවේ රබර් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 1876 දී ස්ථාපිත කරන ලදි. එය ගම්පහ නගරයේ සිට කි.මී. 2 නුදුරින් ගම්පහ මිනුවන්ගොඩ මාර්ගයේ පිහිටා ඇත. මුලින්ම එහි වපසරිය අක්කර 36 වූ අතර, 2005 දී අක්කර 07 ක් ඊට එකතු කරනු ලැබි ය. එහි වර්තමාන වපසරිය අක්කර 43 වේ. වර්ෂයක් තුළ දේශිය හා විදේශිය නරඹන්නන් 150,000 අධික පිරිසක් විසින් මෙම උද්‍යානය වෙත පැමිණේ. ප්‍රදේශයේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා ශාක විතැන් සංරක්ෂණය, මල් වගාව හා භූමි අලංකරණය පිළිබඳ අධ්‍යාපන හා ව්‍යාප්ති සේවා පැවැත්වීම, උද්භිද තොරතුරු බෙදා හැරීම, උද්‍යාන අලංකරණ විද්‍යාව ප්‍රවර්ධනය කිරීම සඳහා මල් වගාව හා පටක රෝපණය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම, ආගමික හා ඓතිහාසික වශයෙන් වැදගත් වෘක්ෂ ආරක්ෂා කිරීම හා නඩත්තුව, අලෙවිය සහ සාමාන්‍ය නඩත්තු කිරීම සඳහා පැළෑටි නිෂ්පාදනය, සුළු පරිමාණ මල්වගාකරුවන් සඳහා වෙළඳපොලක් ලබාදීමට මල් ප්‍රදර්ශන සංවිධාන කිරීම මෙම උද්‍යානය මගින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වේ.

**5.6.1. 2012 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා නිලධාරින්ගේ තොරතුරු**

**උද්‍යානයේ උද්‍යාන කටයුතු සඳහා අනුයුක්ත වී ඇති නිලධාරීන්**


| නිලධාරියාගේ නම | තනතුර | සුදුසුකම | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| චන්ද්‍රිකා ජයවීර මිය | උද්‍යාන පාලක | බී.එස්සී ( විශේෂ) කෘෂි විද්‍යාව, එම්.එස්.සී.(Horti.) | ශාක විද්‍යාව |
| ජේ. කේ. ඒ. තමරා කුමාරි මිය | කෘෂි උපදේශක | එන්.ඩී.ටී (කෘෂි විද්‍යාව) | තවාන් කළමනාකරණය සහ ශාක නිෂ්පාදනය |
| එම්. ඩී. ඩී. එස්. මහයාගොඩ මිය | කෘෂි උපදේශක | එන්.ඩී.ටී (කෘෂි විද්‍යාව) | භූමි අලංකරණය |
| ඒ.ඒ.ටී. මාලනී මිය | කෘෂි උපදේශක | කෘෂි විද්‍යාව පිළිබඳ එක් අවුරුදු ප්‍රායෝගික පාඨමාලාව | භූමි අලංකරණය |
| එස්. ඩී. රම්‍යාකාන්ති මිය | කෘෂි උපදේශක | කෘෂි විද්‍යාව පිළිබඳ එක් අවුරුදු ප්‍රායෝගික පාඨමාලාව | අධ්‍යාපන සහ පුහුණු |
| ආර්.එම්.ටී. ලක්මාලි මිය | වැඩසටහන් සහකාර | බී.ඒ (විශේෂ) (ජනසන්නිවේදනය) | ප්‍රගති මෙහෙයුම් |

**මල් වගා පර්යේෂණ සහ ව්‍යාප්ති ඒකකය සඳහා අනුයුක්ත වී ඇති නිලධාරින්**

| නිලධාරියාගේ නම | තනතුර | සුදුසුකම | කේෂ්ත්‍රය |
|---|---|---|---|
| එම්.සී. වික්‍රමසිංහ මිය | පර්යේෂණ නිලධාරි | බී.එස්සී, එම්.එස්සී | මල්වගා බෝග වල ශිෂ්‍ය විද්‍යාව |
| අනෝමා බෝවත්ත මිය | පර්යේෂණ සහකාර | කෘෂි විද්‍යාව ඩිප්ලෝමා | ශාක නිෂ්පාදනය |
| එම්.ඒ.එන්. ජයවර්ධන මිය. | කෘෂිකර්ම උපදේශක | කෘෂි විද්‍යාව ඩිප්ලෝමා | මල් වගා ව්‍යාප්තිය |
| ඩී. වී. ආර්. ඒ. පෙරේරා මයා | කෘෂිකර්ම උපදේශක | කෘෂි විද්‍යාව ඩිප්ලෝමා | මල් වගා ව්‍යාප්තිය |
| ඒ.පී. සිරිවර්ධන මිය | වැඩසටහන් සහකාර | බී.එස්සී, එම්.එස්සී | මල්වගා ව්‍යාප්තිය/ වගා කිරීම සහ ඇන්තූරියම් ක්ෂුද්‍ර ප්‍රචාරණය |
| ඒ.එන් නානායක්කාර මිය | වැඩසටහන් සහකාර | බී.එස්සී, එම්.එස්සී | මල්වගා ව්‍යාප්තිය/ වගා කිරීම සහ ඕකිඩ් ක්ෂුද්‍ර ප්‍රචාරණය |
| බී.යු.ජී. රණසිංහ මිය | වැඩසටහන් සහකාර | බී.එස්සී | වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇත. |
| ආර්. ඒ. එම්. අයි. රත්නායක මයා | වැඩසටහන් සහකාර | බී.එස්සී. | පටක රෝපණය, ජලජ ශාක සහ ජර්බෙරා වගාව |
| එස්. ඒ. ඒ. යු. සුහසිංහ මයා | වැඩසටහන් සහකාර | බී.එස්සී, එම්.එස්සී | මල් වගා ව්‍යාප්තිය |
| කේ. එල්. කේ. ධර්මදාස මයා | වැඩසටහන් සහකාර | බී.එස්සී, එම්.එස්සී | මල් වගා ව්‍යාප්තිය |

**5.6.2.** **නරඹන්නන්**

මෙම වසරේදී 194,956 නරඹන්නන් සංඛ්‍යාවක් (දේශිය නරඹන්නන් 194,713 ක් සහ විදේශිය නරඹන්නන් 243) උද්‍යානය නරඹා ඇත. පසුගිය වසර හා සංසන්දනය කරන විට එය 4.6 % වැඩිවීමකි.




**උද්‍යානය නැරඹුවන්**

**5.6.3.** ආදායම

මෙම වසරේදී එලිමහන් හා ගෘහස්ථ පැළ ද සෙසු පැළ ආශ්‍රිත ද්‍රව්‍යය විකිණීමෙන් හා වාහන උද්‍යානයට ඇතුළු කිරීමෙන් ද බෝට්ටු සවාරි මගින් සහ විවිධ අවස්ථාවලට ප්‍රධාන ක්‍රීඩා පිට්ටනිය කුලියට දීම මගින් ද ආදායම් උපයන ලදි .

| කාණ්ඩය | ආදායම (රු.) |
|---|---|
| නරඹන්නන් | 9,300,940.00 |
| පැමිණෙන ලද වාහන | 3,045,275.00 |
| පැළැටි සහ අනෙකුත් ක්‍රියාකාරකම් | 686,905.00 |
| ප්‍රකාශන අලෙවිය | 15,060.00 |
| පිට්ටනි කුළියට දීම | 685,500.00 |
| චිත්‍රපට සහ අනෙකුත් ක්‍රියාකාරකම් | 171,040.00 |
| බෝට්ටු පැදීම | 797,600.00 |
| **එකතුව** | **14,716,622.00** |



**ගම්පහ උද්‍යානය තුළ නරඹන්නන් විනෝද වෙන අවස්ථාවක්**

### 5.7. වන ඖෂධ උද්‍යානය, ගනේවත්ත



කුරුණෑගල සිට මීටර් 15 ක් පමණ ඈතින් වයඹ පලාතේ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පිහිටා ඇත. මෙවැනි ප්‍රදේශයක පිහිටා තිබීම හේතුවෙන් මෙම උද්‍යානයෙහි ඖෂධ පැළැටි වගා කිරීම සඳහා ඉතා හොඳ පරිසරයක් ඇත. මෙය අක්කර 52 ක වපසරියකින් යුක්ත වන අතර, ඉන් භාගයක් පමණ පොල් වගාව සඳහා වෙන් වී ඇත. අක්කර 22 ක් ඖෂධ වගා කර ඇත.

මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වන්නේ දුර්ලභ ඖෂධ පැළැටි වර්ග සංරක්ෂණය කිරීම, ඖෂධ පැළැටි ක්‍රමවත් වගා කිරීම් ක්‍රම පිළිබඳ හා පැළැටි එකතු කිරීමේ ක්‍රම පිළිබඳ අධ්‍යයනයන් කිරීම සහ ඖෂධ පැළැටි පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම වේ. මීට අමතරව දුර්ලභ ඖෂධ පැළැටි වර්ග පිළිබඳ පර්යේෂණ ද සිදු කෙරේ.

#### 5.7.1. 2012 දෙසැම්බර් 31 වන විට කාර්ය මණ්ඩලය

| නිලධාරින්ගේ නම | තනතුර | සුදුසුකම් | Discipline |
|---|---|---|---|
| අබේසිංහ මයා | කාර්ය භාර නිලධාරි | භූමි අලංකරණය සහ උද්‍යාන පාලනය පිළිබඳ ඩිප්ලෝමාව | ඒකක කළමනාකාරිත්වය |
| ඊ.පී.එස්. ඉලංගරත්න මිය | කෘෂිකර්ම උපදේශක | කෘෂි විද්‍යා ඩිප්ලෝමාව | ශාක නිෂ්පාදනය |

**5.7.2. ආදායම**

මෙම වසර අතරතුරේදී ඖෂධ පැළෑටි 12,298 ක් නිෂ්පාදනය කර ඇති අතර, 9,936 ක් අලෙවි කර ඇත. ඊට අමතර පොල් පැල 16,637 ක් අලෙවි කර ඇත. 2012 වර්ෂයේදී ආදායම වශයෙන් රු. 583,552/- උපයා ඇත.

**5.7.3. නරඹන්නන්**

ඖෂධ පැළෑටි සංරක්ෂණය සහ ඖෂධ පැළෑටි භාවිතය පිළිබඳ ඉගෙනීමට නරඹන්නන් 733 ක් උද්‍යානය වෙත පැමිණ ඇත. එසේම පැළෑටි සහ අවශ්‍යතා අනුව බෙහෙත් මිලදී ගැනීම සඳහා ද මිනිසුන් උද්‍යානය වෙත පැමින ඇත.

## 5. 8. වියළි කලාපිය උද්භිද උද්‍යානය, හම්බන්තොට




අවු: 130 කට පසුව දේශිය විශේෂඥයන් විසින් සැලසුම් කොට බිහිවූ ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය වනුයේ වියළි කලාපිය උද්භිද උද්‍යානයයි. මෙම උද්‍යානය දකුණු පළාතේ හම්බන්තොට මිරිජ්ජවිල ප්‍රදේශයේ පිහිටා ඇති අතර, සංවර්ධන වැඩ කටයුතු 2006 වර්ෂයේ ආරම්භ වී ඇත.

විවිධ වූ මානව ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස වියළි කලාපීය කැලෑ වෘක්ෂලතා ඉතා ශ්‍රිඝ්‍රයෙන් වැනසී ගොස් ඇති අතර, පසුගිය වසර 30 ක කාලය තුළ හම්බන්තොට ප්‍රදේශයේ වියළි කලාපීය වෘක්ෂලතා 98% කින් වැනසි ගොස් ඇත. මෙම උද්‍යානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වනුයේ කෙටි කාලීන හා දිර්ඝ කාලීනව වියළි සහ ශුෂ්ක කලාපීය පැළෑටි සංරක්ෂණය කිරීම, වියළි කලාපයේ එතරම් නොදන්නා මෙන්ම මේ දක්වා භාවිත කොට නැති පැළෑටි වර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම, ඖෂධ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, වියළි කලාපයේ උද්භිද විද්‍යාව හා මල් වගාව පිළිබඳ අධ්‍යාපනය හා පුහුණුව ලබාදීම යන කටයුතුය.

**5.8.1 2012 දෙසැම්බර් 31 දක්වා කාර්ය මණ්ඩලය**

| නිලධාරින්ගේ නම | තනතුර | සුදුසුකම් | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| ඊ.එම්.එස්. ඒකනායක මයා | කාර්ය භාර නිලධාරි | බී.එස්සී | ඒකක කළමනාකරණය |
| මදූරි පිරිස් මිය | මල්වගා ඒකකයේ ප්‍රධානි | බී.එස්සී | මල්වගා ව්‍යාප්තිය සහ සංවර්ධනය |
| එම්.ජී.එස්. කුමාර මයා | වැඩසටහන් සහකාර | බී.එස්සී | වෘක්ෂ පාලනය සහ ඖෂධ පැළෑටි නඩත්තුව |

## 5.9. තෙත් කලාපිය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල

උද්‍යානයේ වපසරිය අක්කර 62 ක් වන අතර එය බස්නාහිර පළාතේ අවිස්සාවේල්ල, ඉලුක්ඕවිට ප්‍රදේශයේ ඉලුක්ඕවිට ප්‍රාථමික පාසැලට යාබදව පිහිටා ඇත. ප්‍රදේශයේ වඳවීමට ලක් වී ඇති ශාක මෙම උද්‍යානය තුළ විතැන් සංරක්ෂණය කරනු ලබන අතර, උද්‍යානය දිවයිනේ සංචාරක කර්මාන්තය හා මල්වගා ක්ෂේත්‍රය ඉහල නැංවීමට දායක වෙයි. උද්භිද විද්‍යාව හා පරිසර විද්‍යාව හදාරන සිසුන් හා පර්යේෂකයන් සඳහා පර්යේෂණ සඳහා සුදුසු ප්‍රදේශයක් ලෙසත්, අධ්‍යාපනික පර්යේෂණ සඳහා සුදුසු ප්‍රදේශයක් ලෙසත්, පුද්ගලයන් සඳහා විනෝස්වාදය ගෙන දෙන ප්‍රදේශයක් ලෙසත් මෙම උද්‍යානය සංවර්ධනය කෙරේ.



### 5.9.1. 2012 දෙසැම්බර් 31 වන විට කාර්ය මණ්ඩලය

| නිලධාරියාගේ නම | තනතුර | සුදුසුකම් | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| ආර්.ඩී.ඩී. කුලරත්න මයා | කාර්ය භාර නිලධාරි | විද්‍යාවේදී උපාධිධාරි | ඒකක කළමනාකරණය |
| එස්.එස්. ඔක්නාපිටිය මයා | කෘෂි උපදේශක | කෘෂි විද්‍යාව ඩිප්ලෝමාව | භූමි අලංකරණය සහ උද්‍යාන පාලනය |

6

# ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුළ මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩසටහන යටතේ නිවර්තන කලාපීය හොඳම උද්භිද උද්‍යානයන් වීම කරා

රාජ්‍ය ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව වන මහින්ද චින්තන වැඩසටහනට සමගාමීව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්, වැඩසටහන් සහ දෙපාර්තමේන්තුව විසින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව; සියලුම ජෛව කාලගුණික ප්‍රදේශ ආවරණය වන පරිදි නව උද්භිද උද්‍යාන පිහිටුවීම සහ ඒමගින් විතැන් සංරක්ෂණ කටයුතු පුළුල් කිරීමේ වැඩසටහන; යෝග්‍ය පර්යේෂණ වැඩසටහන් හරහා අත්‍යාවශ්‍ය තාක්ෂණික සහ අනෙකුත් හැකියාවන්ගෙන් වගාකරුවන් සන්නද්ධ කිරීම තුළින් දේශීය මල් වගා කර්මාන්තය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන; විදේශීය ශ්‍රම වෙලද පොලෙහි ඉල්ලුමට සරිලන පරිදි උසස් කාලීන තාක්ෂණ ක්‍රමවේද ඇතුලත් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පිලිගත් මල් වගාව හා භූමි අලංකරණය පිළිබඳ පුහුණු පාඨමාලා ඇති කිරීමට කටයුතු කිරීමේ වැඩසටහන; පාරිසරික සංචාරක කර්මාන්තය රට තුළ ප්‍රචලිත කිරීමට අදාලව උද්‍යානයන්හි ක්‍රියාකාරකම් අදාල පරිදි වෙනස් කිරීම් ආදි වැඩසටහන් යටතේ විවිධ කාර්යයන්හි නියැලෙන ලදී.

**6.1. ශාක විතැන් සංරක්ෂණය**

---

*දස අවුරුදු වැඩසටහන් ප්‍රකාශනය (හරිත ලංකා වැඩසටහන)* :

*මෙහෙවර 2 යටතේ වෘක්ෂලතාදිය සහ පරිසරය පද්ධතිය ආරක්ෂා කිරීම*

**ශ්‍රී ලංකාවේ සියළු ජෛව කාලගුණික ප්‍රදේශවල විතැන් සංරක්ෂණය ව්‍යාප්ත කිරීම**

---

ශ්‍රී ලංකාවේ දුර්ලභ සහ තර්ජණයට ලක් වූ දේශීය ශාක සංරක්ෂණය කිරීම හා එවැනි ශාක වඳ වී යාමෙන් ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ වටිනා ශාක සම්පත ආරක්ෂා කිරීමේදී ඒක දේශික ශාක, රක්ෂිත ප්‍රදේශ තුළ හෝ පිහිටි ස්ථානයේ සංරක්ෂණය කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. ශාක විතැන් සංරක්ෂණය කිරීමත්, ස්ථානීය සංරක්ෂණය මෙන්ම ඉතා වැදගත් සංරක්ෂණ ක්‍රමයකි.

විටෙක උද්භිද උද්‍යාන විතැන් සංරක්ෂණය සඳහා ඉතා වැදගත් භූමිකාවක් උසුලයි. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, හක්ගල උද්භිද උද්‍යානය, ගම්පහ උද්භිද උද්‍යානය සහ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය දැනට ආවේණික, දේශීය පමණක් නොව සමහර විදේශීය ශාක වල විතැන් සංරක්ෂණ ශාක එකතුවට හිමිකම් කියයි. අලුතින් ඉදි කරන උද්භිද උද්‍යාන වන , හම්බන්තොට මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සහ අවිස්සාවේල්ල ඉලුක්ඕවිට තෙත් කලාපීය උද්භිද උද්‍යාන ඒ ඒ ප්‍රදේශ වල ශාක සංරක්ෂණ ක්‍රියාකාරකම් ඉලක්ක කර කටයුතු කරයි.

දෙපාර්තමේන්තුව මෙම වසර තුලදි විවිධ මාදිලියේ සංරක්ෂණ ආයතන සහ සංවිධානවල සහයෝගිත්වයෙන් පර්යේෂණ, ශාක සංගණන, ශාක ගවේෂණ, ශාක ප්‍රතිෂ්ඨාපනය කිරීම, තාක්ෂණික සහාය, අධ්‍යාපනය සහ උපදේශන ආදී විවිධ වැඩසටහන්/ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

### 6.1.1. *නව උද්භිද උද්‍යාන ඉදිකිරීම*

#### 6.1.1.1. *මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය*

මෙම උද්‍යානයේ සංවර්ධන ක්‍රියාකාරකම් වසර පුරා කඩිනම්ව ක්‍රියාත්මක කරන ලදි.

පිවිසුම් දොරටු සංකිර්ණයෙහි, රථ ගාලෙහි, වැසිකිළි සහිත ගිම්හාන කුටි ත්‍රිත්වයෙහි ඉදිකිරීම් කටයුතු ජාතික ඉංජිනේරු සංස්ථාව මඟින් සිදුකර ඇත. පිවිසුම් දොරටු සංකිර්ණයේ ඉදිකිරීම් කටයුතු 40% ද රථ ගාලේ ඉදිකිරීම් කටයුතු 30% ද වැසිකිළි සහිත ගිම්හාන කුටිවල ඉදිකිරීම් කටයුතු 50 % ද මෙම අවුරුද්ද තුලදි නිමා කරන ලදි.




**හම්බන්තොට උද්භිද උද්‍යානයේ ප්‍රධාන පිවිසුම ඉදිකිරීමේ කටයුතු**



**හම්බන්තොට උද්භිද උද්‍යානයේ ගිම්හාන කුටිවල ඉදි කිරීමේ කටයුතු**

විවෘත කිරීමෙන් පසු නරඹන්නන්හට පහසුකම් ලබාදීම වර්ධනය කිරීම සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් පානීය ජල පද්ධතියක් ස්ථාපනය කිරීමට මුල පුරන ලදි.

හම්බන්තොට දිස්ත්‍රික් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් නිල නිවාස ඉදිකිරීම අරඹා ඇති අතර 25% ක් ඉදිකිරීම් කටයුතු නිමා කර ඇත.

උද්‍යානයේ භූමි අලංකරණ ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කර ඇත. නව ප්‍රදේශ සංවර්ධනය සහ නව භූමි අලංකරණ ලක්ෂණ සහ අළුත් ව්‍යුහයන් උද්‍යානයට එකතු කර ඇත. ප්‍රධාන පුෂ්ප උද්‍යානය, අඩි පාරවල්, හරස් මාර්ග සහ ලඳු උද්‍යාන සහ කැක්ටස් එකතුව ඇතුළු විවිධ ශාක එකතුන් ද උද්‍යානයට එක් කරන ලදි . ශාක වගා කිරීමේ වැඩසටහන යටතේ උද්‍යානයේ ශාක එකතුව තවදුරටත් පුළුල් කරන ලදී.



**හම්බන්තොට උද්භිද උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම**

#### 6.1.1.2. ඉලුක්ඹිවිට තෙත් කලාපීය උද්භිද උද්‍යානය

උද්‍යානය සංවර්ධනය කිරීමේ කටයුතු මේ අවුරුද්ද තුලදී ක්‍රියාත්මක කරන ලදී. භූමි සැකසීම සහ භූමි අලංකරණ කටයුතු හරහා උද්භිද උද්‍යානයේ භූමි භාවිතය ඉහල නැංවීමට සිදු කරන ලදී. ප්‍රධාන පිවිසුම් දොරටුව ජාතික ඉංජිනේරු සංස්ථාව මගින් ඉදි කර ඇති අතර, එහි 50% ක් ඉදිකිරීම් කටයුතු නිමා කර ඇත. උද්‍යානයේ මහජන පහසුකම් සැලැස්වීම සඳහා ද්විත්ව වැසිකිලි පද්ධතිය ඉදිකරමින් පවති.

උද්‍යානයේ අභ්‍යන්තර මාර්ගවල තත්ත්වය ඉහල නැංවීමට සහ උද්‍යාන අලංකරණය ඉහල නැංවීම සඳහා " ඉන්ටර්ලොක්ස් (Interlocks) " අතුරා අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කර ඇත.

උද්‍යානය සඳහා පොකුණු තුනක් එක් කර ඇති අතර, භූමි අලංකරණ හා ගෘහ නිර්මාණාත්මක ලක්ෂණ වැඩි කිරීම සඳහා වැව් විශාල කරන ලදි .

වර්ෂාවේදී උද්‍යානයේ ඉහල කොටසට විශාල ජල ධාරාවක් ඇද හැලෙන නිසා භූමිය නායයාම්වලින් ආරක්ෂා කිරීමට කාණු පද්ධතියක් උද්‍යානය තුළ ස්ථාපිත කරන ලදී.



⮝ වැසිකිලි ඉදිකිරීම



⮝ ප්‍රධාන පිවිසුමේ ප්‍රවේශපත්‍ර කවුන්ටරය ඉදි කිරීම

**6.1.2. විතැන් සංරක්ෂණය සහ ජෛව විවිධත්ව සංරක්ෂණ කටයුතු සිදු කිරීම**

**6.1.2.1. උද්‍යානයන්හි ශාක එකතුව වැඩිදියුණු කිරීම**

***අ. පැළ නිෂ්පාදනය***

ශාක එකතුව වැඩි දියුණු කිරීම, උද්‍යාන වල භූමි අලංකරණය තවදුරටත් වැඩි කිරීම හා අලෙවි සැල්වල විකිණීම සඳහා එළිමහන් පැළෑටි සහ ගෘහස්ථ පැළ නිපදවන ලදි.

| **උද්‍යානය** | **කාණ්ඩය** | **ප්‍රමාණය** |
|---|---|---|
| රාජකීය උද්භිද උද්‍යානය | එළිමහන් ශාක | 180,320 |
| හක්ගල උද්භිද උද්‍යානය | එළිමහන් ශාක හා ගෘහස්ථ පැළ | 84,584 |
| ගම්පහ උද්භිද උද්‍යානය | එළිමහන් ශාක හා ගෘහස්ථ පැළ | 44,350 |
| වන ඖෂධ උද්‍යානය | ඖෂධ පැළෑටි | 12,298 |
| මල්වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය | ඕකිඩ්, ඇන්තූරියම්, විසිතුරු පත්‍රික හා ජර්බෙරා පැල | 77,014 |
| **එකතුව** | | **398,566** |

***ආ. වනෝද්‍යානයන්ට එක් කළ ශාක***

උද්‍යානයන්හි වනෝද්‍යානවල ශාක විවිධත්වය ඉහල නැංවීම සහ එම ශාක එකතුන්හි සාරවත් බව ඉහල දැමීම සඳහා දුර්ලභ, ඒකදේශික හා වඳවීමේ තර්ජණයට ලක් වූ ශාක එක් කිරීම සිදු කරන ලදී. විවිධ උද්භිද උද්‍යානයන්හි වන උද්‍යානයන්ට එක් කරන ලද ශාක පිළිබඳ ලැයිස්තුවක් පහත වගුවේ දැක්වේ **;**

| **උද්‍යාන** | **ප්‍රමාණය** |
|---|---|
| රාජකීය උද්භිද උද්‍යානය | 301 |
| හක්ගල උද්භිද උද්‍යානය | 137 |
| ගම්පහ උද්භිද උද්‍යානය | 35 |
| වන ඖෂධ උද්‍යානය | 458 |
| **එකතුව** | **931** |



**පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ වන උද්‍යාන දර්ශණයක්**

රාජකීය උද්භිද උද්‍යානයේ වන උද්‍යානයට එක් කළ සමහර වටිනා ශාක විශේෂ එකතුන් කිපයක් පහත වගුවේ දැක්වේ.

| **ශාක කණ්ඩය** | **ශාක විශේෂ** | **ශාක ප්‍රමාණය** | **රුක් උයනේ කොටස** | **සංරක්ෂණ ක්‍රමය** |
|---|---|---|---|---|
| ආවේණික සහ දේශිය | *Elaeocarpus coriaceous* | 01 | F | EN |
| | *Maduca clavata* | 01 | F | EN |
| | *Mitragyna parvifolia* | 02 | P | VU |
| ආවේණික සහ දේශිය | *Goniothalamus gardneri* | 01 | E | VU |
| | *Margaritaria indicus* | 01 | D | VU |
| | *Neolitsea fuscata* | 01 | C | VU |
| | *Elaeocarpus coriaceus* | 01 | F | EN |
| | *Nymphaea nouchali* | 4 | උද්‍යානය දකුණු දිශාවේ ඕකිඩ් නිවස අසල පොකුණ | VU |

මෙම වටිනා ශාක විශේෂ වලට අමතරව උද්‍යානයේ පර්ණාංග ශාක එකතුව ද වැඩි දියුණු කිරීම සඳහා අළුත් ශාක විශේෂ හඳුන්වා දෙන ලදී.

***ඇ. ශාක ප්‍රතිකාර***



උද්භිද උද්‍යානයන්හි ශාක මැනවින් පවත්වාගෙන යාම සහ ශාකවල මනා කළමනාකරණය සඳහා ශාක ප්‍රතිකාර ක්‍රම සිදු කරන ලදී. ප්‍රධාන උද්භිද උද්‍යාන තුනෙහි ගස් 181 ක් විවිධ ප්‍රතිකාර ක්‍රම මඟින් ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන ලදී. ඒවාහි විස්තර පහත දැක්වේ;

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ පිහිටි වෘක්ෂ 37 ක් සඳහා ප්‍රතිකාර කරන ලදී. වෘක්ෂ 15 ක් සඳහා කඳෙහි කුහර සඳහා ප්‍රතිකාර ලබාදෙන ලදී. ඒවා *Nothopegia beddomei*(H-110, *Durio zebethinus*(K-7), *Cassia siamea*(H-47), *Mo uriria guianensis*(Aa-140), *Terminalia bellirica*(I), *Chrysophyllum roxburghii(*F-207), *Lagerstroemia* sp.(Aa), *Cynometra* sp. (B), *Ficus benghalensis*(D-396), *Brownea ariza*(D-393), *Lagerstroemia speciosa(*I), *Cynometra ramiflora(*B235), *Calicarpa reeviesii*(E-27), *Citrus decumana*(E-1) යන ශාක වේ. දිරාගිය සහ කැඩුණු අතු ඉවත් කිරීම මඟින් *Caryocar butyrosum*(D-55), *Durio zebethinus*(D-209), *Hura crepitans* (Main Border), *Ficus benjamina*(A-118), *Ficus elastica*(A-120), *Ficus* sp.(A-60) යන ශාක ආරක්ෂා කරන ලද අතර, මැරුණු වෘක්ෂ කේෂ්ත්‍රයෙන් ඉවත් කිරීම ද සිදු කරන ලදී. කේබල් සවි කිරීම මඟින් *Ficus benjamina* (G), *Diospyros ebenum* (Ab) යන ශාක ආරක්ෂා කරන ලදී.

***ඇ. උද්භිද විද්‍යාත්මක සංගණනය***



ආර්ථකමය වශයෙන් විභවයක් ඇති ශාක නිදර්ශක තිරසාරව සහ විවිධ කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමට සහ විතැන් සංරක්ෂණ ක්‍රියාකාරකම් ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාමාර්ග වලට මූලික වන වියලි හා තෙත් කලාපීය වඳවීමේ තර්ජනයට ලක් වූ ශාක නිදර්ශක එකතු කිරීම හා ගවේෂණය සඳහා උද්භිද විද්‍යාත්මක සමීක්ෂණ කටයුතු මෙම අවුරුද්ද තුලදී සිදු කරන ලද අතර එය 2013 වර්ෂයේද ක්‍රියාවට නැංවේ.

මේ යටතේ කේෂ්ත්‍ර අධ්‍යයන චාරිකා 09 ක් සිදු කරන ලද අතර, එහිදී සපුෂ්ප ශාක (flowering plants) විශේෂ 280, මී වන ( fern) ශාක විශේෂ 12ක් ද, පාසි ( Mosses) විශේෂ 147 ක් ද එකතු කරන ලද අතර, ඒවා හඳුනා ගැනීම් සිදු කරන ලදී. මෙම අවුරුද්ද තුලදී එකතු කර හඳුනා ගත් සපුෂ්ප ශාක අතුරින්, දැඩි අන්තරායට ලක් වූ ශාක 01 ක් ද , අන්තරායට ලක් වූ

ශාක 13 ක් ද, අවදානමට ලක් වූ ශාක 11 ක් සහ ආසන්න වශයෙන් අවදානමට ලක් වූ ශාක 10 හඳුනා ගෙන ඇති අතර, විතැන් සංරක්ෂණ ක්‍රියා මාර්ග අවශ්‍ය අවස්ථාවලදී ගෙන ඇත.

ක්ෂේත්‍ර ගවේෂණයන්හිදී එකතු කර ගත් ශාක පිළිබඳ විස්තරයක් පහත සඳහන් නිදර්ශක වගුවේ දැක්වේ.;

| නියමිත ස්ථාන | එකතු කළ නිදර්ශක ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ආවෘත බීජ | මී වන | පාසි |
| හන්තාන | 52 | 1 | 42 |
| ලුල්කඳුර | 43 | 3 | 45 |
| ගන්නෝරුව | 18 | - | - |
| රුහුණු එන්පී | 54 | 1 | - |
| යාපනය | 28 | - | - |
| අමනාවල- අම්පානේ පීආර් | 30 | 4 | 25 |
| රාක්ෂාව වත්ත | 18 | - | 25 |
| කන්නෙලිය වන රක්ෂිතය | 20 | 3 | - |
| පිෂිං හට් | 17 | - | 10 |
| **එකතුව** | **280** | **12** | **147** |

***ඉ. සෙසු ශාක ගවේෂණ ක්‍රියාකාරකම්***

**"Wild Flowers of Sri Lanka"** සහ **"Way Side Trees of Sri Lanka"** යන ග්‍රන්ථ සකස් කිරීම සඳහා අවශ්‍ය ශාක එකතු කිරීමට ඔක්තෝම්බර්, නොවැම්බර් මාසවලදී රිවර්ස්ටන්, ලුල්කඳුර, කැලෑබොක්ක යන ප්‍රදේශවල කරන ලද ක්ෂේත්‍ර ගවේෂණ වලදී වන මල් නිදර්ශක 74 ක් ද ද පාර දෙපස පිහිටි ශාක 95 ද, කැමරාවට හසු කර ගන්නා ලදි.

උද්භිද විද්‍යාත්මක ශාක සංගණනයේ කොටසක් වශයෙන් රාජකීය උද්භිද උද්‍යානයේ විතැන් සංරක්ෂණය කරන ලද ශාක එකතුව වැඩි දියුණු කිරීමේ අභිලාෂයෙන් ද වඳවීමේ තර්ජණයට ලක්ව සිටින/දුර්ලභ ආවේණික හා දේශීය ශාක එකතු කිරීමේ ක්ෂේත්‍ර සංචාර 07 ක් සිදු කරන ලදී. ක්ෂේත්‍ර සංචාර හා එකතු කරන ලද ශාක පිළිබඳව තොරතුරු පහත වගුවේ දක්වා ඇත .

| ගවේෂණය කළ ක්ෂේත්‍රය | කාලය | එකතු කල ශාක විශේෂ | | | |
|---|---|---|---|---|---|
| | | ආවේණික | දේශීය | වඳවී යන | පීඩාවට ලක් වියහැකි |
| හන්තාන | දවස් 2 | 3 | 11 | 2 | - |
| ලුල්කඳුර | දවස් 1 | 8 | 4 | 6 | 4 |
| ගන්නෝරුව | දවස් 1 | 4 | 5 | 3 | 2 |
| යාපනය | දවස් 4 | 2 | 4 | 3 | - |
| පහල කඩුගන්නාව | දවස් 1 | 1. | 10 | 1 | - |
| හල්ගොල්ල වත්ත | දවස් 1 | 5 | 5 | 5 | 1 |
| මොරගහකන්ද | දවස් 5 | නිදර්ශක 97 ක් එකතු කළ අතර හඳුනා ගැනීම ක්‍රියාත්මක කරන ලදි | | | |

ගම්පහ උද්භිද උද්‍යානයේ නොමැති ශාක එකතු කිරීම සඳහා ද , දුර්ලභ ආවේණික ශාක එකතු කිරීම සඳහා ද පිල්ලිකුට්ටුව, අඹේපුස්ස හා මාලිගාතැන්න යන ප්‍රදේශවල ක්ෂේත්‍ර ගවේෂණ හයක් සිදු කරන ලදී. එකතු කර ගන්නා ලද ශාක සඳහා අදාල විතැන් සංරක්ෂණ ක්‍රම යොදා ගන්නා ලදි.





**ශාක එකතුව සඳහා ක්ෂේත්‍ර ගවේෂණ සිදු කිරීම**

***ඊ. ශාක ලේබල් කිරීම***



විද්‍යාත්මක සහ ශාක ආශ්‍රිත අනෙකුත් තොරතුරු උද්‍යානයන් වෙත පැමිණෙන නරඹන්නන් සඳහා ලබාදීමට ශාක පිළිබඳ විද්‍යාත්මක හා අනෙකුත් තොරතුරු ඇතුලත් ලේබල් ශාක මත සවි කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී .

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ලේබල් 1,100 සවි කරන ලදී; සමරු වෘක්ෂ සඳහා ලේබල් 71 ද සවි කරන ලදී. ඊට අමතරව නාම පුවරු 36 ක් සකසා අදාල ස්ථානවල සවි කරන ලද අතර, ශාක පිළිබඳ විස්තරාත්මක තොරතුරු සහිත පුවරු අළුත්වැඩියා කරන ලදී. අළුත් පුවරු 10 ක් ද නිර්මාණය කරමින් පවති. ගම්පහ උද්භිද උද්‍යානයේ ශාක ලේබල් 750 ක තොරතුරු භාෂා තුනෙන්ම (සිංහල, ඉංග්‍රීසි, දෙමල) ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි. හක්ගල උද්භිද උද්‍යානයේ ශාක ලේබල් 401 ක් හා නාම පුවරු 10 ක් ශාක මත සවි කරන ලදි.

***උ. ශාක දත්ත ගබඩා වැඩි දියුණු කිරීම***

දේශිය ශාක 15 ක හා , ආවේණික ශාක 12 හා විදේශිය ශාක 28 ක ජීවන චක්‍රයේ හා ශාක වලට ක්ෂුද්‍රමය වෙනස්වීම් හා කාලගුණයේ අන්තර් වාර්ෂික වෙනස් වීම් බලපාන ආකාරයත් එම ශාකවල ජන්ම භූමිය හා සම්බන්ධ තොරතුරු ලබා ගැනීම වර්ෂය පුරා සිදු කන ලදී. එමෙන්ම උද්‍යානයේ ශාක එකතුවේ ඉලෙක්ට්‍රෝනික දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා ශාක නිදර්ශක වල ඡායාරූප ද ලබා ගන්නා ලදී.

සටහන් තබා ගැනීමේ පද්ධතියක් වශයෙන් ශාක සඳහා අංක ක්‍රමයක් හඳුන්වා දෙන ලද අතර දැනට සිටුවා ඇති සෑම ශාකයකම නම හා එහි මුලාරම්භය සොයා ගැනීම සඳහා අංකයක් එහි සෑම ශාකයකටම යොදා ගන්නා ලදි .

රුක් උයනේ කොටස් සහ සිතියම් නැවත ප්‍රතිශෝධනය කරන ලදී. මෙම ප්‍රතිශෝධන යටතේ D කොටසේ කළුවර රුක් එකතුව ද ශිෂ්‍ය උද්‍යානයට යාබද පාම් ගස් එකතුව හා Q කොටසේ ශාක එකතුව ප්‍රතිශෝධනය කරන ලදී.

**6.1.2.2. ශාකාගාරය වැඩි දියුණු කිරීම**

***අ. ශාක ගවේෂණය හා හඳුනා ගැනීම මගින් ශාකාගාරය වැඩි දියුණු කිරීම***

ක්ෂේත්‍ර ගවේෂණය මගින් එකතු කර ගන්නා ලද නිදර්ශක හඳුනා ගෙන වර්ගීකරණය කර, නිදර්ශක කාව සකසා ජාතික ශාකාගාරයේ නිදර්ශක එකතුව වැඩි දියුණු කරන ලදි. ජාතික ශාකාගාර එකතුන් වැඩි දියුණු කිරීම පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.



***මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයක් පැවැත්වීම***

| වර්ගය | මූලය/ස්ථානය | ස්ථිර කර එකතු කළ නිදර්ශක | ශාකාගාරය |
|---|---|---|---|
| *ආවෘත බීජක* | හන්තාන | 38 | ජාතික ශාකාගාරය |
| | ලුල්කඳුර | 40 | ජාතික ශාකාගාරය |
| | ගන්නෝරුව | 14 | ජාතික ශාකාගාරය |
| | වැළඩකන්ද වනය-කුරුණෑගල-2011 | 53 | ජාතික ශාකාගාරය |
| | උඩදුම්බර ප්‍රදේශය | 6 | ජාතික ශාකාගාරය |
| | දොළුකන්ද වන රක්ෂිතය | 12 | ජාතික ශාකාගාරය |
| | ශ්‍රී පාදය | 11 | ජාතික ශාකාගාරය |
| මී වන | ලුල්කඳුර | 2 | ජාතික ශාකාගාරය |
| | හක්ගල | 64 | හක්ගල උද්භිද උද්‍යානය - ශාකාගාරය |
| පාසි | හන්තාන | 37 | ජාතික ශාකාගාරය |
| | ලුල්කඳුර | 40 | ජාතික ශාකාගාරය |
| | හෝර්ටන්තැන්න -2011 | 45 | ජාතික ශාකාගාරය |
| | කැලෑබොක්ක | 10 | ජාතික ශාකාගාරය |
| | ගන්නෝරුව - 2011 | 15 | ජාතික ශාකාගාරය |
| | කිතුල්ගල- 2008/2012 | 50 | ජාතික ශාකාගාරය |

***ආ. ශාකාගාර නිදර්ශක සහ සෙසු එකතුන්***

ශාකාගාර නිදර්ශකවල සාමාන්‍ය නඩත්තු කටයුතු පවත්වාගෙන යන ලදී. සිදු කරන ලද සාමාන්‍ය නඩත්තු කටයුතු පහත වගුවේ දක්වා ඇත.

| | ක්‍රියාකාරකම | නිදර්ශක ප්‍රමාණය |
|---|---|---|
| 1. | ශාකාගාර නිදර්ශක අලුත්වැඩියා කිරීම | 12,367 |
| 2. | කෘමි උවදුරට ලක්වූ නිදර්ශක සඳහා පිළියම් කිරීම (විෂ යෙදීම) | 60 |
| 3. | නිදර්ශක අධිශීතකරණයේ තැබීම | 9,554 |
| 4. | නිදර්ශක සවි කිරීම (Mounted) | 358 |
| 5. | නිදර්ශක නැවත සවි කිරීම (re – mounted) | 5 |
| 6. | නිදර්ශකවලට ආවරණ එකතු කිරීම | 874 |
| 7. | ගණවලට ආවරණ එකතු කිරීම | 709 |
| 8. | නිදර්ශක පවිත්‍ර කිරීම | 20,693 |
| 9. | පොත් පවිත්‍ර කිරීම | 1121 |
| 10. | නිදර්ශක තද කිරීම ( Press) | 403 |
| 11. | ආවරණය කරන ලද ගණවලට , නිදර්ශක, ගණවලින් යුත් කාඩ්පත් සඳහා ලේබල් ටයිප් කරන ලද ගණන | 1,335 |

***ඇ. ශාකාගාර දත්ත සැකසීම හා නිදර්ශක සහා අංක ක්‍රමයක් ඇති කිරීම***

ශාකාගාර නිදර්ශක සඳහා අංක ක්‍රමයක් ඇති කිරීමට (පවුල, පරම්පරා ආදි සම්පාදනය කිරීම) මූලික ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී.

### 6.1.2.3. ජෛව විවිධත්ව සංරක්ෂණය

***අ. ජාතික රතු දත්ත නාමාවලිය සැකසීමේ ව්‍යාපෘතිය***

ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් වශයෙන් වඳ වී යාමේ අවදානමට ලක් වී ඇති ශාක පිළිබඳව ජාතික රතු දත්ත නාමාවලි සහිත ග්‍රන්ථය සකස් කිරීමට අවශ්‍ය නිදර්ශක ඇගැයීම් සහ තොරතුරු එක් රැස් කිරීම පරිසර අමාත්‍යාංශයේ හා ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ සහායෝගීත්වයෙන් සිදු කරන ලද අතර, ජාතික රතු දත්ත නාමාවලි ග්‍රන්ථය 2012 දෙසැම්බර් 18 දින කොළඹ වෝටර්ස් ඒජ් හෝටලයේදී එළි දකින ලදී.



**ශ්‍රී ලංකාවේ වෘක්ෂලතාවල රතු දත්ත කාණ්ඩය අවසන් කිරීම සඳහා විශේෂඥයින්ගේ රැස්වීම් පැවැත්වීම**

***ආ. පර්යේෂණ වැඩසටහන් (කොළඹ විශ්ව විද්‍යාලයේ සහයෝගීත්වයෙන් )***

පර්යේෂණ වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක කර ඇත. (eg. Bioassay guided fractionation and Isolation of bioactive natural compounds from Bryophytes, Taxonomy and cytology of selected spices of Sri Lankan Gesneriaceae and Grassland diversity & exploration for threatened flora Hanatana Mountain Range)

***ඇ. ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම***

| වැඩසටහනේ මාතෘකාව | සහභාගිවූවන් ප්‍රමාණය | සහභාගිවූ ආයතනය / කණ්ඩායම | වැඩසටහන පැවැත්වීමට දායක වූ ආයතනය |
|---|---|---|---|
| දේශීය ඖෂධ හා ජෛව විවිධත්ව හමුවේ ශාකාගාරයේ කාර්යභාරය | 31 උපාධි අපේක්ෂිත සිසුන් | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | ජාතික ශාකාගාරය |
| | 90 සිසුන් | වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය | ජාතික ශාකාගාරය |
| ශාක වර්ගීකරණය සහ ශාකාගාරක්‍රමවේද | 100 සිසුන් | කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය ආයතනය | ජාතික ශාකාගාරය |
| | 123 සිසුන් | විවෘත විශ්ව විද්‍යාලය, නාවල | ජාතික ශාකාගාරය |
| | 82 සිසුන් | විවෘත විශ්ව විද්‍යාලය, පොල්ගොල්ල | ජාතික ශාකාගාරය |
| | 25 උපාධි අපේක්ෂිත සිසුන් | කොළඹ විශ්ව විද්‍යාලය | ජාතික ශාකාගාරය |
| | 9 උපාධි අපේක්ෂිත සිසුන් | කැළණිය විශ්ව විද්‍යාලය | ජාතික ශාකාගාරය |
| | 25 පුහුණුවන්නන් | ජාතික වන ජීවී පර්යේෂණ සහ පුහුණු ආයතනය, ගිරිතලේ | ජාතික ශාකාගාරය |
| ශාකාගාරයේ ජෛව විවිධත්ව සංරක්ෂණය සහ ශාක වර්ගීකරණය | 25උපාධි අපේක්ෂිත සිසුන් | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | ජාතික ශාකාගාරය |
| | 33 පුහුණුවන්නන් | | ජාතික ශාකාගාරය |

| වැඩසටහනේ මාතෘකාව | සහභාගිවූවන් ප්‍රමාණය | සහභාගිවූ ආයතනය / කණ්ඩායම | වැඩසටහන පැවැත්වීමට දායක වූ ආයතනය |
|---|---|---|---|
| ශාක රූප විද්‍යාව පිළිබඳ දේශනය | 78 සිසුන් | රාජකීය උද්භිද උද්‍යානයේ භූමි අලංකරණ සහ මල්වගා පාඨමාලාව | ජාතික ශාකාගාරය |
| ජෛව විවිධත්ව සංරක්ෂණය හමුවේ ශාකාගාරයේ භූමිකාව සහ ශාක වර්ගීකරණ විද්‍යාව සහ ප්‍රායෝගික පුහුණු සැසිය | 30 උපාධි අපේක්ෂිත සිසුන් | ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | ජාතික ශාකාගාරය |
| | 60 සිසුන් | ජාතික අධ්‍යාපන පුහුණු විද්‍යාලය පුලස්තිපුර, පොළොන්නරුව | ජාතික ශාකාගාරය |
| | 45 සිසුන් | භූමි අලංකරණය සහ මල් වගා පුහුණු පාඨමාලාව, රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය | ජාතික ශාකාගාරය |
| | 25 සිසුන් | ඩී.එස්. සේනානායක විද්‍යාලය, මහනුවර | ජාතික ශාකාගාරය |
| | 25 සාමාජික | තරුණ සත්වවේදීන්ගේ සංගමය | ජාතික ශාකාගාරය |
| ශාක හඳුනා ගැනීම | 21සිසුන් | ලග්ගල පල්ලේගම මධ්‍ය මහා විද්‍යාලය | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය |
| | 10 සිසුන් | නයිවල කාර්මික විද්‍යාලයේ උසස් ජාතික ඩිප්ලෝමා | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය |
| | 20 ඩිප්ලෝමා පාඨමාලා සිසුන් | මොරටුව ජාතික සැලසුම් මධ්‍යස්ථානය | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය |
| | 20 උපාධි අපේක්ෂිත සිසුන් | කෘෂි විද්‍යා පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය |
| ජාතික උද්භිද උද්‍යානයන් ජෛව විවිධත්වය කරා (ක්ෂේත්‍ර චාරිකාව සමඟ) | 210 නව තෝරාගත් පුහුණු නිලධාරින් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය |
| ශාක හඳුනා ගැනීම, වෘක්ෂ රැක බලා ගැනීම සහ පවත්වාගෙන යාම, වන උද්‍යාන ක්‍රමවේද | 22 පාසැල් සිසුන් | මහානාම විද්‍යාලය, මහනුවර | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය |
| වෘක්ෂ රැක බලා ගැනීම සහ පවත්වාගෙන යාම | 20 සිසුන් | වන ජීවී සංරක්ෂණ සංගමය | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය |
| ජෛව විවිධත්වය | 218 සිසුන් | විවෘත විශ්ව විද්‍යාලයේ ස්වාභාවික විද්‍යා පීඨය | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය |
| ශාක සහ ජෛව විවිධත්ව සංරක්ෂණය | 321 ළමුන් | ප්‍රදේශයේ පාසැල් | ගම්පහ උද්භිද උද්‍යානය |

***ඇ. ශ්‍රී ලංකාවේ තලස ශාකවල පරිණාමය, ජෛව විවිධත්වය සහ සංරක්ෂණ වැඩමුළු***

ශ්‍රී ලංකාවේ තලස ශාක (Bryology) පිළිබඳව නේවාසික, දින 06 ක ජාතික වැඩමුළුවක් අගෝස්තු මස 06 සිට 11 දක්වා පේරාදෙනිය රාජකීය උද්භිද උද්‍යානයේදී පවත්වන ලදී. මෙම වැඩමුළු ජාතික ශාකාගාරය විසින් පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුව සඳහා සම්පත් දායකයින් වශයෙන් විශේෂඥයින් 3 දෙනෙකුට මේ සඳහා ආරාධනා කරන ලදී. ආචාර්ය බෙනීටෝ සී.ටැන් (ජාතික විශ්ව විද්‍යාලය, සිංගප්පූරුව) ආචාර්ය යේ. වෙන් (සෙන්ජියං විශ්ව විද්‍යාලය, චිනය) ආචාර්ය සුමුදු රූබසිංහ ( පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව) සම්පත් දායකයින් ලෙස සම්බන්ධ කර ගන්නා ලදී.



*ජාතික ශාකාගාරයේ දී වැඩමුළුවක ප්‍රායෝගික වැඩසටහන ක්‍රියාත්මක කරමින්*

***ඊ. දැනුවත් කිරීමේ පත්‍රිකා සැකසීම***

ශාකාගාරය සහ ශාකාගාර ක්‍රමවේද පිළිබඳ අත්පත්‍රිකා සැකසීම, පහත් ශාක පිළිබඳ අත්පත්‍රිකා සකසා සංස්කරණය කිරීම සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ ආවේණික ශාක සහ ශ්‍රී ලංකාවේ විදේශික ශාක සහිත අත්පත්‍රිකා 4 ක් සැලසුම් කර ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සුදානම් කරන ලදි .



*" ජෛව විවිධත්වය සහ ශ්‍රී ලංකාවේ බ්‍රයෝෆ්ලෝරා සංරක්ෂණය" පිළිබඳ ජාතික වැඩමුළු*

**6.2.** මල්වගා සංවර්ධනය

---

***ප්‍රකාශනය:* මහින්ද චින්තන ඉදිරි දැක්ම - දස අවුරුදු සංවර්ධන සැලැස්ම**

**" නිවර්තන කලාපීය මල් වගා ක්ෂේත්‍රයේ පුරෝගාමී වීමට ශ්‍රී ලංකාව සතු විභවයන් බොහෝය. ඒවා උකහා ගෙන ශ්‍රී ලාංකීය මල්වගා ක්ෂේත්‍රය ලොව පුරා ප්‍රචලිත කිරීමට මං සැලසීම "**

---

*පර්යේෂණ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් මගින් මල්වගාවේ සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ ක්‍රියාකාරකම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.*

### 6.2.1 පර්යේෂණ වැඩසටහන්

ක්ෂේත්‍රයේ දැනට පවත්නා ගැටළු පිළිබඳ අවධානය යොමු කරමින් මල්වගා කර්මාන්තය දිවයින පුරා ප්‍රවර්ධනය කිරීම සඳහා ක්ෂුද්‍ර ප්‍රචාරණය, ශෂ්‍ය විද්‍යාව, පසු අස්වනු ක්‍රමවේද , පලිබෝධ සහ රෝග කළමනාකරණය සහ පැළ අභිජනනය යටතේ විවිධ පර්යේෂණ වැඩසටහන් දියත් කරන ලදි .



***Chirita mooni***

#### 6.2.1.1. විමර්ශන

***අ. ක්ෂුද්‍ර ප්‍රචාරණය***

දේශීය හා ඒකදේශික ශාක වන *Chirita mooni* and *Bambusa multiplex* හෙවත් වැට උණ වල ක්ෂුද්‍රප්‍රචාරණය සඳහා මුලපත්‍ර සකස් කිරීම අවසන් කරන ලදි.

***ආ. ශෂ්‍ය විද්‍යාව***



***Polyscias balfouriana***



***Ophiopogon chinensis***

*Polyscias balfouriana* ශාකයේ දඬු සිටුවීමේදී සිටුවීම සඳහා යෝග්‍යතම මාධ්‍ය හා දඬුවල දිග ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ එක් වී අත්හදා බැලීම් සිදු කරන ලදි.

ශාක දඬු සිටුවීමේ ක්‍රියාවලියේදි බලපාන හඳුනානොගත් රෝග කාරකයන් හඳුනාගන්නා ලද අතර, රෝග පාලන ක්‍රම ද අධ්‍යයන කරන ලදි. සෙ.මී. 2 ක වට ප්‍රමාණයකින් හා සෙ.මී. 15 උසින් යුත් ශාක දඬු සිටුවීමේදි වැලි සහ කොහු බත් 1:1 ප්‍රමාණයන්ගෙන් යොදා ගැනිම යෝග්‍යතම මිශ්‍රණය වෙයි.

වර්ග දෙකක කැපූ ඇන්තුරියම් මල්වල ආගන්තුක මුල් ඇතිවීම කෙරෙහි වර්ධක හොමෝනවල බලපෑම අත්හදා බැලීම මෙන්ම , බෝගන්විලා ශාක දඬු සිටුවීම සඳහා ශාක දඬුවල පරිණතභාවය හා සිටුවීමේ මාධ්‍යයේ බලපෑම අධ්‍යයනය කිරීමත්; *Ophiopogon chinensis* වර්ධනයේදි GA3 හි බලපෑම විමර්ශනය කිරිමත් ශෂ්‍ය ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක වෙමින් පවති.

***ඇ. පලිබෝධ හා රෝග පාලනය***

ඉහත සඳහන් මුල ක්‍රියාදාමයේදී *Polyscias balfouriana* කැපුම් හඳුනා නොගත් රෝගයේ බලපෑම හඳුනා ගත් අතර, රෝගය මර්ධනය කිරීමේ ක්‍රමවේදය අධ්‍යයනය කරන ලදී .



***Ficus benjamina***

ශෂ්‍ය පර්යේෂණ වැඩටහන් ලෙස මෙහෙයවූ විමර්ශනවලදි පහත සඳහන් ප්‍රතිඵල සොයා ගෙන ඇත. *Ficus benjamina* ශාක ව්‍යාප්ත කිරීම සඳහා යෝග්‍යතම සිටුවීමේ මාධ්‍ය වැලි හා කොහු බත් 1:1 මිශ්‍රණය වන අතර ශාක දඬුවල උස ප්‍රමානය 4" වේ.

***ඇ. පසු අස්වනු ක්‍රමවේද***

නෙළන ලද නෙලුම් (Nelumblum) මල් බඳුනක තබා ගැනිමේදී ඒවා ක්ලෝරොක්ස් ( 0.4 %) + $Casco_4$ (200 mgli) + සෝඩා ( 1% නම් මි. 10/1) මාධ්‍යයේ ඔබා තිබිමෙන් වඩා හොඳ ප්‍රතිඵල ලබාගත හැකි බවට අත්හදා බැලීම්වලින් හෙලි වි ඇත.



**6.2.1.2.** ***පැළ අභිජනනය***

---

නව භෝග වර්ග, එසේ නැතහොත් වර්ණ, ඵලදාව, තත්ත්වය , දැරිම ආදියෙන් යුත් විවිධ භෝග වර්ග නිෂ්පාදනය කිරීම සඳහා විශේෂයෙන් දේශිය පැළ, ඕකිඩ් හා ඇන්තුරියම් සම්බන්ධයෙන් ශාක දෙමුහුන් කිරීමේ වැඩසටහන් කිහිපයක් සිදු කරන ලදි.

විවිධ දෙමුහුන් පැළැටි ඇතුළු දේශිය ශාක එකතුව සියල්ල සම්බන්ධයෙන් පොදු නඩත්තු කටයුතු සිදු කරන ලදි. බීජ මඟින් *Exacum affine* ශාක 50, ශාක දඬු මඟින් *Chirita* spp., පැල 150 ක් ව්‍යාප්ත කරන ලදි.

*Chirita* spp. ශාකයේ පත්‍ර මඟින් ව්‍යාප්ත කරන ලදි. තිරස් ලෙස මාධ්‍ය තුළ සිටුවනු ලැබූ පත්‍රවල කුඩා පැළැටි හටගෙන තිබෙනු දක්නට ලැබිණි. කොටස් 3 කට කපා තිබූ මෙම පත්‍රවල පැළ විශාල සංඛ්‍යාවක් හටගෙන තිබුනි.

රසායනාගාරයේදි ඕකිඩ් බිජ කරල් 16 ක් ප්‍රරෝහණය කරනු ලැබිණි .



***Chirita sp.***

### 6.2.2. ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන

දිවයිනේ මල් වගා සංවර්ධනය අරමුණු කර ගත් 2005 වර්ෂයේ ආරම්භ කළ ජාතික මල්වගා පර්යේෂණ සංවර්ධන වැඩසටහන (" සුවහස් මල් " වැඩසටහන) මෙම වසරේදී එහි අරමුණු කරා ලගා වෙමින් ක්‍රියාත්මක වී ඇත. මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු තුනක් ඇත.

1. වැවිලිකරුවන් සංවිධාන ගත කිරීම
2. සංවිධානය වූ වවන්නන් සවිබල ගැන්වීම
3. වෙළඳපොල සම්බන්ධතාවය වර්ධනය කිරීම සහ ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල පහසුකම් සපයා දීම

| දිස්ත්‍රික්කය | සංගම් ප්‍රමාණය |
|---|---|
| මහනුවර | 07 |
| මාතලේ | 06 |
| කෑගල්ල | 14 |
| කුරුණෑගල | 04 |
| ගම්පහ | 27 |
| කළුතර | 07 |
| කොළඹ | 04 |
| රත්නපුර | 04 |
| හම්බන්තොට | 05 |
| අනුරාධපුරය | 01 |
| බදුල්ල | 06 |
| නුවරඑළිය | 09 |
| පුත්තලම | 06 |
| එකතුව | 100 |

දිස්ත්‍රික්ක මට්ටමින් ගොවි සමාජ පිහිටුවීම

#### 6.2.2.1 වවන්නන්ගේ සංගම් සංඛ්‍යාව වැඩි කිරීම

මෙම වසර තුළදී වගාකරුවන්ගේ අළුත් සංවිධාන තුනක් මෙම වැඩසටහන යටතේ ස්ථාපිත කරන ලදී. දිවයින පුරා පළාත් හයක මල්වගාවට සම්බන්ධ ගොවි සංගම් 100 දක්වා ඉහල නැංවූ අතර ඉහත වගුවේ සඳහන් දිස්ත්‍රික්කවල සහ පහත සිතියමේ ඒවා සඳහන් කර ඇත.

#### 6.2.2.2. සංවිධානය වූ වවන්නන් සවිබල ගැන්වීම


***අ. පුහුණු සහ වැඩමුළු පැවැත්වීම***

තාක්ෂණික දැනුම ලබාදීමට සහ වවන්නන්ගේ හැකියාව නැංවීම සඳහා මල් වගාව පිළිබඳව විභවයක් ඇති වගාකරුවන් සඳහා වැඩමුළු පවත්වන ලදී.

| දිස්ත්‍රික්කය | වැඩමුළු ගණන | සහාභාගිවූවන් ප්‍රමාණය |
|---|---|---|
| ගම්පහ | 01 | 40 |
| මහනුවර | 01 | 61 |
| මාතලේ | 01 | 65 |
| පුත්තලම | 01 | 50 |
| කෑගල්ල | 20 | 828 |
| හම්බන්තොට | 03 | 128 |
| නුවරඑළිය | 03 | 65 |
| **එකතුව** | **30** | **1237** |



වවන්නන් සඳහා පවත්වන ලද පුහුණු වැඩමුළුවක්




**දිවයින පුරා සුවහස්මල් වවන්නන්ගේ සංගම් වල ව්‍යාප්තිය**

***ආ. ක්ෂේත්‍ර උපදෙස් සැපයීම***

ක්ෂේත්‍ර කාර්යන්හි නිරත වී සිටිනා විට පැන නඟිනා ගැටළු සඳහා ක්ෂේත්‍ර උපදෙස් ලබාදෙන අතරතුර විවිධ රුස්වීම්වලට සහභාගි වෙමින් වවන්නන්ගේ ක්ෂේත්‍රයේ විවිධ ගැටළු සඳහා උපදෙස් ලබාදෙන ලදී .

| දිස්ත්‍රික්කය | පැල තවාන් ප්‍රමාණය |
|---|---|
| ගම්පහ | **450** |
| මහනුවර | **42** |
| මාතලේ | **32** |
| පුත්තලම | **13** |
| කෑගල්ල | **244** |
| කළුතර | **89** |
| හම්බන්තොට | **01** |
| නුවරඑළිය | **189** |
| එකතුව | **1060** |



**ක්ෂේත්‍ර උපදෙස් ලබාදෙන ලද පැළ තවාන්**

ගම්පහ, මාතලේ,මහනුවර, කෑගල්ල, නුවරඑළිය, කළුතර, හම්බන්තොට සහ කොළඹ දිස්ත්‍රික්කවල රැස්වීම් 416 පවත්වන ලද අතර, මල් වගාව සම්බන්ධ ගැටළු සාකච්ඡා කරන ලදී.

කෑගල්ල සහ ගම්පහ දිස්ත්‍රික්කවල "සුවහස් මල්" සමාජවල සාමාජිකයින් විසින් හොඳින් පවත්වාගෙන යන විවිධ ප්‍රදේශවල පැළ තවාන් නිරීක්ෂණය සහ ක්ෂේත්‍ර පළපුරුද්ද පිළිබඳව මනා දැනුමක් ගොවින්ට ලබා දිම සඳහා ක්ෂේත්‍ර චාරිකා 11 ක් සංවිධානය කරන ලදී.

***ඇ. මල්වගාව පිළිබඳව කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම***

මල්වගාවේ නියැලී සිටින වවන්නන් සඳහා ඇන්තූරියම් , ඕකිඩ්, ජර්බෙරා සහ කැපූ පත්‍ර වගාව පිළිබඳව කෙටිකාලීන පුහුණු පාඨමාලාවන් පවත්වන ලදී.

| විෂයය | කාලය | පන්ති සංඛ්‍යාව | සහභාගිවූවන් ගණන |
|---|---|---|---|
| ඕකිඩ් වගාව | එක් දින පන්ති | 42 | **1,439** |
| | ප්‍රායෝගික පුහුණු | 23 | **132** |
| | පිට පළාත් සංචාර | 8 | **533** |
| විසිතුරු පත්‍රිකා ශාක වගාව | එක් දින පන්ති | 42 | **1,460** |
| | ප්‍රායෝගික පුහුණු | 24 | **124** |
| | පිට පළාත් සංචාර | 13 | **623** |
| ඇන්තූරියම් වගාව | එක් දින පන්ති | 46 | **1,772** |
| | ප්‍රායෝගික පුහුණු | 26 | **86** |
| | පිට පළාත් සංචාර | 9 | **637** |
| ජර්බෙරා වගාව | එක් දින පන්ති | 14 | **346** |
| පටක රෝපණය | දින පහක පන්ති | 10 | **74** |
| එකතුව | | **257** | **7,226** |

**ඈ. දේශන සහ අනෙකුත් පුහුණු වැඩසටහන් පැවැත්වීම**

මල්වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකය මගින් මල්වගාව සම්බන්ධ දේශන සහ වැඩසටහන් පවත්වන ලදී.

- සිසුන් 128 සඳහා පටක රෝපණය පිළිබඳ ප්‍රායෝගික නිදර්ශක ඇතුළු දේශණ සිදු කරන ලදී.
- අපනයනය සඳහා මල් වගා බෝග පිළිබඳ දේශන මෙන්ම ඇන්තූරියම් බෝග වගාව පිළිබඳ ගම්පහ උද්භිද උද්‍යානයට අයත් මල් සහ විදේශීය පැළ නිෂ්පාදන සමාගමට අයත් වවන්නන් 60 සහ 20 සඳහා ද දේශන පවත්වන ලදී .



**හක්ගල උද්භිද උද්‍යානයේ වවන්නන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වන ලද අවස්ථාවක්**

- බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේහි බෝඹුවල ISTI පුහුණු ආයතනයේ නිලධාරින් 15 දෙනෙකු සඳහා බස්නාහිර පළාතේ වැසි ආවරණය යටතේ විසිතුරු පත්‍රික ශාක, ඕකිඩ් සහ ඇන්තූරියම් වගාව සිදු කරන ආකාරය පිළිබඳ දේශනයක් පවත්වන ලදී .
- වැසි ආවරණ යටතේ කැපු පත්‍රික ශාක වගාව මෙන්ම බොන්සායි වගාව පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බෝඹුවල කෘෂි උපදේශකවරුන් සඳහා පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී.
- සිසුන් 28 ක් සඳහා දෙමළ මාධ්‍යයෙන් ඕකිඩ් වගාව, ඇන්තූරියම් සහ විසිතුරු පත්‍රික ශාක වගාවේ අගයන් පිළිබඳව පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- මාස් හොල්ඩින්ස් පුද්ගලික සමාගමේ 36 දෙනෙකු සඳහා බොන්සායි වගාව පිළිබඳව පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.
- පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ උපාධි අපේක්ෂිත සිසුන් 24 ක් සඳහා ඇන්තූරියම් පරාගනය සහ ජර්බෙරා වගාව පිළිබඳව නිදර්ශනමය ප්‍රායෝගික වැඩසටහනක් පවත්වන ලදී .
- පේරාදෙණිය ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ පුද්ගලයන් 20 දෙනෙකු සඳහා මල්වගා කර්මාන්තයෙහි ආයෝජනය කිරීමේ පරමාර්ථ සහ විසිතුරු පත්‍රික ශාක වගාවේ වාසිදායක තත්ත්වය පිළිබඳව දේශනයක් පවත්වන ලදී.

***හක්ගල උද්භිද උද්‍යානය මගින් පැවැත්වූ මල්වගාව හා සම්බන්ධ පුහුණු සැසි***

| පුහුණු සැසි පිළිබඳ විස්තර | සහභාගිවූවන් ගණන | ආයතනය/විස්තරය |
|---|---|---|
| මල්වගාව | 43 සිසුන් | ජාතික ආධුනිකත්ව පුහුණු ආයතනය |
| | 46 වවන්නන් | නුවරඑළිය සහ ඌව පළාත |
| මල්වගාව සහ භූමි අලංකරණය | 30සිසුන් | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| රෝස සහ ජර්බෙරා වගාව | | දියතලාව සුවහස් මල් සංගමය |
| ජර්බෙරා වගාව , පසු අස්වනු තාක්ෂණය, පලිබෝධ සහ රෝග කළමනාකරණය, රෝස වගාව, පිප්පොසීලා වගාව, හරිත ශාක තාක්ෂණය. | 92 වවන්නන් | නුවරඑළිය දිස්ත්‍රික්කය |
| ජර්බෙරා වගාව, පසු අස්වනු තාක්ෂණය, රෝස වගාව, කානේෂන් වගාව | 83 වවන්නන් | නුවරඑළිය දිස්ත්‍රික්කය |

| පුහුණු සැසි පිළිබඳ විස්තර | සහභාගිවූවන් ගණන | ආයතනය/විස්තරය |
|---|---|---|
| රෝස වගාව | 16 වවන්නන් | කැප්පේටිපොල සහ දඹවින්න ප්‍රදේශය |
| | 16 සිසුන් | කෘෂිකර්ම පුහුණු ආයතනය, නවයාලතැන්න |
| කැපූ මල් කර්මාන්තය. | 15 උපාධි අපේක්ෂිත සිසුන් | රුහුණු විශ්ව විද්‍යාලය |
| කැපූ මල් සහ කපුරු වගාව. | 15 පුහුණුවන්නන් | නුවරඑළිය, කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය |
| ජර්බෙරා වගාව, රෝස හා කපුරු වගාව. | 80 පුද්ගලයින් | සුළු පරිමාණ වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන |
| පෝච්චිගත ශාක නිෂ්පාදනය | 26 වවන්නන් | කැප්පෙටිපොල සුවහස් මල් සංවිධානය |
| ජර්බෙරා වගාව, රෝස, කානේෂන්, කපුරු, ග්ලේඩියොලා සහ හරිත ශාක තාක්ෂණය | 78 වවන්නන් | නුවරඑළිය දිස්ත්‍රික්කය |
| රෝස වගාව, සැරසිලි ශාක සහ භූමි අලංකරණය | 43 ඩිප්ලෝමා පාඨමාලා සිසුන් | පැල්වෙහෙර කෘෂිකර්ම පාසැල |
| රෝස වගාව, ජර්බෙරා සහ ප්‍රායෝගික සැසි සහිත කානේෂන් වගාව . | 05 ගුවන් හමුදා නිලධාරින් | දියතලාව ගුවන් හමුදා කඳවුර |

***ගම්පහ උද්භිද උද්‍යානයේ මල්වගාව හා ආශ්‍රිත පුහුණු සැසි***

පුද්ගලයින් 59,211,290, 207 , සහ 25 ක් සඳහා පිළිවෙලින් ජර්බෙරා වගාව ඇන්තූරියම්, ඕකිඩ්, විසිතුරු පත්‍රික ශාක වගාව හා රෝස වගාව පිළිබඳව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරින් 83 සඳහා විසිතුරු පත්‍රික ශාක පිළිබඳව පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

පාසැල් ළමුන් 55 කට සහ ගුරුවරුන් 08 ක් සඳහා ආරක්ෂිත ව්‍යුහ යටතේ මල්වගාව, බෝග වගාවන් ඇතිකිරීම හා පවත්වා ගන්නා ආකාරය පිළිබඳව වැඩමුළුවක් පවත්වන ලදී.

ගම්පහ උද්භිද උද්‍යානයේදී පුද්ගලයින් 83 ක් සඳහා *Dracaena sanderiana* වගාව පිළිබඳව පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.

**ඉ. ප්‍රකාශන**

පුවත්පත් දැන්වීම් 04 කින් පිටපත් 4000 ක් ද, එක් පත්‍රිකාවකින් පිටපත් 1000 බැගින් කැනාස් වගාව, ඩේලියා වගාව, ඇන්තූරියම් වගාව, ඕකිඩ් වගාව, පෝච්චි ගත කළ ඇන්තූරියම් වගාව, බ්‍රෝමීලියාඩ්ස් වගාව, කපුරු වගාව, විසිතුරු පත්‍රික වගාව, රෝස වගාව, ඩ්‍රෙසීනා වගාව වැනි මාතෘකා යටතේ පත්‍රිකා 11 ක් මුද්‍රණය කර මුදල් අයකර ගැනීමකින් තොරව වගාකරුවන් අතර, බෙදා හැරීමට කටයුතු කරන ලදි.




“ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මල්වගා පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්” නමින් ග්‍රන්ථයක් මුද්‍රණය කර බෙදා හරින ලදී .

ඇන්තූරියම් වගාව, ඕකිඩ් වගාව සහ ඩේලියා වගාව පිළිබඳ පොත් නව තොරතුරු සහ නව ඡායාරූප ඇතුලත් කිරීමෙන් සංස්කරණය විය.

විසිතුරු පත්‍රික ශාක 25 පිළිබඳව පිටපත් 1000 ක් සහ කැපූ මල් පිළිබඳව නව පොත් මුද්‍රණය කර බෙදා හරින ලදී.

***ඊ. ද්‍රව්‍ය, උපකරණ සැපයීම සහ යටිතල පහසුකම් සංවර්ධනය***

වගාකරුවන්ගේ නිෂ්පාදන හැකියාව ගොඩ නැංවීම සඳහා උසස් ගුණාත්මක පැළෑටි හා සෙසු රෝපණ ද්‍රව්‍යය ලබාදෙන අතර, අදාල යටිතල පහසුකම් නැංවීමට කටයුතු කරන ලදී.

මහනුවර, මාතලේ, කොළඹ, කළුතර, පුත්තලම, ගම්පහ, කුරුණෑගල, හම්බන්තොට සහ බලංගොඩ දිස්ත්‍රික්කවල වවන්නන්ගේ සංගම්වල සාමාජිකයින් 74 දෙනෙකු සඳහා සෙවන දැල් රෝල් 300 ක් පමණ බෙදා හරින ලදී .

බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල පාරජම්බුල කිරණ පරාවර්තනය කරන පොලිතින් රෝල් වැවිලි සංගම්වල සාමාජිකයින් අතරේ බෙදා හරින ලදී.

යටිතල පහසුකම් සංවර්ධනය සහ තවාන් ස්ථාපනය කිරීම සඳහා දිවි නැගුම වැඩසටහන යටතේ බෙදා දුන් ද්‍රව්‍යය (ජී.අයි පයිප්ප, සෙවන දැල් සහ ශාක) අදියර තුනක් යටතේ මෙම අවුරුද්ද තුළදී සම්පූර්ණ කරන ලදී.



**හම්බන්තොට වැවිළිකරුවන් සඳහා සෙවන දැල් බෙදා හැරීම**



**දිවි නැගුම වැඩසටහන යටතේ *Dracaena sanderiana* වගාව ස්ථාපිත කිරීම**

### 6.2.2.3 වෙළඳපොල සහාය ලබාදීම

මල් වගාකරුවන්ගේ වෙළඳපොල හැකියාව ඉහල නැංවීම සඳහා සුළු පරිමාණ ප්‍රදර්ශන සහ දිස්ත්‍රික් මට්ටමේ මහා පරිමාණ ප්‍රදර්ශන පවත්වන ලදී.

| දිස්ත්‍රික්කය | සුළු පරිමාණ ප්‍රදර්ශන | මහ පරිමාණ දිස්ත්‍රික් මට්ටම |
|---|---|---|
| ගම්පහ | **33** | **02** |
| මහනුවර | 15 | **01** |
| මාතලේ | 01 | **01** |
| කෑගල්ල | 37 | **-** |
| හම්බන්තොට | 05 | **01** |
| පුත්තලම | 02 | **01** |
| බදුල්ල | 01 | **-** |
| කළුතර | 04 | **03** |
| කොළඹ | 05 | **-** |
| කුරුණෑගල | 04 | **01** |
| රත්නපුර | 02 | |
| **එකතුව** | **109** | **10** |



**සංවිධානය කරන ලද ප්‍රදර්ශනයක දර්ශනයක්**

### 6.2.3. උද්‍යානයන් තුළ මල්වගා සංවර්ධන ක්‍රියාකාරකම්



පේරාදෙණිය මල්වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකයේ ද සහය ඇතිව ගම්පහ උද්භිද උද්‍යානයේ මල් වගා කේෂ්ත්‍රයට අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී. ඒවා පහත පරිදි වේ.

- ඇන්තූරියම් ක්ෂුද්‍ර ප්‍රචාරණය සහ ඕකිඩ් සඳහා රෝපිත සහ උපරෝපිතයන් ආරම්භ කිරීම ක්‍රියාත්මක කර ඇත. මී වන, ජර්බෙරා සහ ජලජ ශාක එකතුව ඉතා හොද මට්ටමක පවත්වාගෙන යන ලදී.
- ලිය අභිමන් වැඩසටහන යටතේ ඇන්තූරියම් පැල 4600 සහ ඝන මීටර් 2,425 කළු පැහැති නයිලෝන් දැල් වගාකරුවන් 115 දෙනෙකු අතර බෙදා හරින ලදී.
- දැනුම නංවාලීම සහ තාක්ෂණික සහ අනෙකුත් දක්ෂතා නංවාලීමට ඇන්තූරියම් වගාව සහ විසිතුරු ශාක වගාව පිළිබඳව පුහුණු වැඩසටහනක් /වැඩමුළුවක් “ලිය අභිමන්” සහ දිවි නැගුම වැඩසටහන් යටතේ මල් වගා කේෂ්ත්‍රයේ ස්වයං රැකියා වල නියුතු කාන්තාවන් 168 දෙනෙකු සඳහා පවත්වන ලදී.



**හම්බන්තොට උද්‍යානයේ පැළ තවාන්වල සමහර ඕකිඩ් මල් වර්ග පිපි තිබෙන අයුරු**

- ඇන්තූරියම් වගාව පිළිබඳව මීරිගම ගුවන් හමුදා නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර උපදෙස් ලබාදෙන ලදී. ඒකකයට පැමිණි පුද්ගලයින් 20 දෙනෙකු සඳහා මල්වගා කර්මාන්තයේ ආයෝජනයන් පිළිබඳ සහ පැළ තවාන් ආරම්භ කිරීම පිළිබඳ තොරතුරු ලබා දෙන ලදී.



**මල්වගා ව්‍යාප්ති කාර්යාලය ඉදිකිරීම**

මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සහ ඉලුක්ඕවිට තෙත් කලාපීය උද්භිද උද්‍යානය පිහිටි ප්‍රදේශවල වවන්නන් හට මල් වගාව සම්බන්ධව පහසුකම් සැපයීම සඳහා පේරාදෙණිය මල් වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ සහාය ඇතිව විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී.



**හම්බන්තොට වවන්නන් සඳහා පුහුණු සැසියක් පවත්වාගෙන යාම**

- ඇන්තූරියම් වගාව, ඕකිඩ් සහ විසිතුරු පත්‍රික ශාක වගාවන් සඳහා ආරක්ෂිත ගෘහ සකස් කළ අතර පැළ රෝපණය සහ අනෙකුත් නඩත්තු කටයුතු නිසි පරිදි සිදු කරන ලදී. කැක්ටස් වගාව උද්‍යානයේ ආරම්භ කළ අතර, 1,221 කැක්ටස් පැළෑටි පේරාදෙණිය උද්භිද උද්‍යානයේ සිට මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය වෙත මාරු කරන ලදී.
- පසුගිය වසරේ තායිලන්තයේ ආනයන කර වියළි කලාපීය උද්භිද උද්‍යානයේ ස්ථාපිත කල ඕකිඩ් පැල වල මල් හට ගත් අතර, ඒවා පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ඕකිඩ් ගෘහයේ ප්‍රදර්ශනය කරන ලදි.



**පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ඇති විසිතුරු පත්‍රික ශාක ක්ෂේත්‍ර කාර්යාලය**

- අවශ්‍ය විවිධ පහසුකම් සැපයීම මගින් මල් වගා සංවර්ධන වැඩසටහන තෙත් කළාපීය උද්භිද උද්‍යානයේ ද ක්‍රියාත්මක වූ අතර, ප්‍රදේශයේ වගාකරුවන්ට විවිධ ආකාරයේ පහසුකම් සපයන ලද අතර, පැල රෝපණ වැඩසටහන යටතේ *Draceana sanderiana*, ඇන්තූරියම්, ඕකිඩ් ශාක ආරක්ෂිත ගෘහවල රෝපණය කරන ලදී. එමගින් උද්‍යානයේ මල්වගා පැලෑටි එකතුවද වැඩිදියුණු කරන ලදී.

- හෙන් කලාපීය උද්භිද උද්‍යානයේ ජානප්ලාස්ම එකතුව වැඩිදියුණු කිරීම සඳහා 350 ක් ඕකිඩ් පැල තායිලන්තයෙන් ආනයනය කරන ලදී.

වන ඕකිඩ් 345 ක් උද්‍යානයන්හි ඕකිඩ් පැළ තවාන්වලදී දේශිය ඕකිඩ් එකතුවට එකතු කරන ලදී.

ඕකිඩ් අංශයේ සියළුම මල් සඳහා බලපාන රෝග කාරක තත්ත්වයන් නිරීක්ෂණය කරන ලදී. රෝග කාරකය හදුනා ගැනිමට කටයුතු සිදු කරන ලද අතර, රෝගය පාලනය කිරීම සිදු කරමින් පවතී.

### 6.2.4 උද්‍යානයන්හි මල්වගා කටයුතු වලට අදාල අංශයන් වැඩි දියුණු කිරීම

වියළි කලාපීය උද්භිද උද්‍යානයේ සෙවන දැල් ගෘහ දෙකක් පිහිටු වන ලද අතර, මල් වගා ව්‍යාප්ති කාර්යාලයක් ද පිහිටුවන ලදී.

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ඕකිඩ් පැල තවානේ කම්කරුවන් සඳහා කාමර, ගබඩා කාමර සහ ක්ෂේත්‍ර කාර්යාලයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කරන ලද අතර, ගම්පහ උද්භිද උද්‍යානය සඳහා සේවක විවේකාගාරයක් හා ගබඩා කාමරයක් ඉදි කිරීම ආරම්භ කර ඇත.

පසුගිය වසරේ පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ මල්වගා අංශය සඳහා ආරම්භ කළ ක්ෂේත්‍ර කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු සහ විසිතුරු පත්‍රික ශාක පැළ තවානේ කම්කරුවන් සඳහා කාමරයක් ඉදිකිරීම සම්පූර්ණ කර ඇත .



**පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ඕකිඩ් පැළ තවානේ ක්ෂේත්‍ර කාර්යාලයක් ඉදි කිරීම**

### 6.3. අධ්‍යාපනය සහ පුහුණුව

***මහින්ද චින්තන: ඉදිරි දැක්ම - දස අවුරුදු සංවර්ධන සැලැස්ම – කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය***

***ප්‍රකාශය:* "ජීවිතයට නිපුණතාවයක් - නිපුණතාවයට රැකියාවක්"; දේශිය සහ විදේශීය කම්කරු වෙළඳපලක් ඉල්ලුම කර ගනිමින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් උසස් තාක්ෂණයෙන් යුත් පුහුණුවක් සැපැයීම**

දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ මල් වගා කර්මාන්තයේ වර්තමාන හා අනාගත අවශ්‍යතා කෙරෙහි නිරතුරුව සැලකිල්ල යොමු කරමින් න්‍යායාත්මක මූලධර්ම ප්‍රායෝගිකව යොදා ගනිමින්, ශ්‍රී ලංකාවේ රැකියා විරහිත තරුණ පිරිස් තුල මල් වගා හා භූමි දර්ශන සම්පාදනය කිරීමේ කුසලතා සහ අවබෝධය වැඩි දියුණු කිරීමට , උද්‍යාන විද්‍යාව සැලසුම්

කිරීමේ හැකියාව ඇති කිරීමට සහ වැඩි දියුණු කිරීමට දේශිය හා විදේශිය රැකියා අවස්ථා සලසා දීමට මල් වගාව හා උද්‍යාන භූමි අලංකරණය පිළිබඳ වාර්ෂික හා ද්වි වාර්ෂික ඩිප්ලෝමා පුහුණු පාඨමාලා පවත්වයි.

මහජනයා, පාසැල් හැර ගිය තරුණ තරුණියන්, කුඩා ව්‍යාපාරිකයින් සිසුන් සහ අනෙකුත් විශේෂඥ පුද්ගලයින් සඳහා මල් වගාව සම්බන්ධ කෙටි කාලීන(එක් දින, දෙදින ) පුහුණු සැසි සහ මල්වගාව සහ භූමි අලංකරණය සැලසුම් පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාවන් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරයි. මීට අමතරව ගස් රැක බලා ගැනීම සහ පවත්වාගෙන යාම, භූමි අලංකරණය සහ මල් සැකසුම්, පැළෑටි සංරක්ෂණය ආශ්‍රිත අනෙකුත් ක්ෂේත්‍ර අරභයා 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානයේදී වැඩසටහන් 4000කට වැඩියෙන් සංවිධානය කර පවත්වන ලදී . (ජෛව විවිධත්ව සංරක්ෂණය, ශාක සංරක්ෂණය සහ ශාක වර්ගීකරණය සහ මල් වගාව සම්බන්ධව පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ වැඩි විස්තර සඳහා 40,41 සහ 47,48,49 යන පිටු බලන්න)

### 6.4 උද්‍යාන පහසුකම් වැඩි දියුණු කරමින් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය

---

**මහින්ද චින්තන: ඉදිරි දැක්ම- දස අවුරුදු සංවර්ධන සැලස්ම**

***ප්‍රකාශනය:* " රටෙහි සංචාරක විභවයන් වන පරිසර සුන්දරත්වය සහ ස්වාභාවික භූ ලක්ෂණ පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් සංචාරක ක්ෂේත්‍රයට අදාල ක්‍රියාකාරකම්, පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට යොමු කිරීම ".**

---

උද්‍යානයන්හි තත්ත්වය උසස් මට්ටමක පවත්වාගෙන යාම, වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා මේ අවුරුද්ද පුරා කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

#### 6.4.1. *රාජකීය උද්භිද උද්‍යානයේ සංවර්ධන ක්‍රියාකාරකම්*

අභ්‍යන්තර භූමි අලංකරණය වැඩි කිරීම සහ අභ්‍යන්තර මාර්ගවල තත්ත්වය ඉහල නැංවීම සඳහා අභ්‍යන්තර මාර්ග පද්ධතිය අලුත්වැඩියා කරන ලදී. ආබාධිත පුද්ගලයන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකාරයට නවීන පෙනුමකින් යුත් ප්‍රවේශ පත් මධ්‍යස්ථානයක් ගොඩ නගන ලද අතර සිහිවටන මිලදී ගැනීමේ අලෙවිසැලෙහි ඉදිකිරීම් කටයුතු ද අවසන් කොට ඇත.





- ඩී.ටී. ඒකනායන දේශන ශාලාවේ අලුත්වැඩියා කිරීම
- ලංකා පොකුණ අසල පිහිටි උයන් කුටිය අලුත්වැඩියා කිරීම
- නව පෙනුමකින් යුත් සිහිවටන මිලදී ගැනීමේ අලෙවිසැල සහ නව ප්‍රවේශපත්‍ර කවුන්ටරය
- පර්ගෝලාව (ලියමඩුල්ලෙන් වැසුණු ප්‍රදේශය) අලුත්වැඩියාව





පැළ ඉතා හොඳින් කළමනාකරණය කිරීමේ අරමුණෙන් දැල් ගෘහයක් නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. උද්‍යානයේ මල් පැළ සිටුවා ඇති කොටසේ ජල සම්පාදන පද්ධතියක් ස්ථාපිත කොට පැළ සඳහා ප්‍රමාණවත් ජල සැපයීමක් ලබාදෙන ලදි .

උද්‍යානයේ ඇතැම් බෝක්කු සහ කානු අලුත්වැඩියා කරන ලදි. උද්‍යානයේ අලංකාරය සහ තත්ත්වය ඉහල දැමීමේ අරමුණෙන් උයන් කුටි, වැසිකිළි, කම්කරු නිළ නිවාස සහ නිලධාරි නිළ නිවාස ඇතුළු අනෙකුත් ගොඩනැගිලි අළුත්වැඩියා කරන ලදි.

උද්‍යාන භූමි අලංකරණ කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ අරමුණෙන් නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ, උද්‍යාන උපකරණ මිලදී ගන්නා ලදී.

### 6.4.2. හක්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන ක්‍රියාකාරකම්



අලුතින් සංවර්ධනය කළ ශිඛර උද්‍යානය

උද්‍යානයේ මාර්ග පද්ධතිය සහ උද්‍යානයේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රධාන මාර්ගය කාපට් කිරීම සහ සමහර කොටස් වල ස්ලැබ් ඇතිරීම සිදු කර ඇත. ශාකවල මනා කළමනාකරණය සඳහා පැළ තවාන්වල පිහිටි පොලිතින් ගෘහ සඳහා දිය බිංදු ඉසිරුම් ක්‍රමය ස්ථාපනය කළ අතර පවතින පොලිතින් ගෘහ අලුත්වැඩියා කරන ලදී



➤ වැඩි දියුණු කළ අඩිපාරවල්



➤ අලුත්වැඩියා කරන ලද පොලිතීන් ගෘහ

උද්‍යානයේ මායිම් වැට ද අලුත්වැඩියා කරන ලදි.

උද්‍යානයේ භූමි අලංකරණ ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා සහ උද්‍යානයේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා උයන් කුටි , කාර්යාල ගොඩනැගිල්ල, ප්‍රවේශ පත්‍ර කවුන්ටරය , පොකුණු සහ වැසිකිළි ප්‍රතිසංස්කරණය කිරීම ක්‍රියාත්මක කරන ලදී.

මාර්තු මස මැද සිට අප්‍රේල් මස අවසන් වන තෙක් කාලය උද්‍යානය නැරඹීමට හොඳම කාලයයි. මේ වසරේදී ද මෙම කාලය තුල රෝස හා ඕකිඩ් ඇතුළු විවිධ මල් වර්ගවලින් උද්‍යානය අලංකාර විය. නරඹන්නන් විශාල ප්‍රමානයක් උද්‍යානයේ අසිරිය නැරඹීමට පැමිණෙන ලදී.

මෙම වසරේදීද උද්‍යානය මනා ලෙස පවත්වාගෙන යාම මෙන්ම උද්‍යානය අලංකාර කිරීම සඳහා භූමි අලංකරණ ලක්ෂණ සහ භූමිය වැඩි දියුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

බැහැර දමන ද්‍රව්‍ය හා වියලි ශාක පත්‍ර ප්‍රතිචක්‍රිකරණය සඳහා කොම්පෝස්ට් පොහොර සාදන ප්‍රදේශයක් පිහිටුවා ඇති අතර, එහි සාදන කොම්පෝස්ට් පොහොර උද්‍යානයේ භාවිතයට යොදා ගන්නා ලදී.

උද්‍යානයේ භූමි අලංකරණ කටයුතු කාර්යක්ෂමව කළමනාකරණ කිරීම සඳහා නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන උපකරණ මිලදී ගන්නා ලදී.

### 6.4.3. ගම්පහ උද්භිද උද්‍යානයේ සංවර්ධන ක්‍රියාකාරකම්


උද්‍යානයේ භූමි අලංකරණ ලක්ෂණ සහ මාර්ගවල තත්ත්වය වැඩි කිරීම සඳහා අභ්‍යන්තර මාර්ග පද්ධතිය කාපට් කිරීම සිදු කරන ලදී.

ළමුන් සඳහා සෙල්ලම් කිරීමේ ප්‍රදේශයට නව උපකරණ එකතු කරන ලදී.

නිළ නිවාස වල වාරි මාර්ග පද්ධතිය අලුත්වැඩියා කිරීම නිමා කර ඇත. නව රථ ගාලෙහි බෝක්කු අලුත්වැඩියා කිරීම ක්‍රියාත්මක කරන ලදී. පොම්පාගාරය අලුත්වැඩියා කිරීම ද නිමා කර ඇත. උද්‍යානයේ අලංකාරය වැඩි දියුණු කිරීම සෙසු භූමි සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත. උද්‍යානයේ උසස් මට්ටමක පවත්වාගෙන යාම සඳහා උද්‍යාන ගොඩනැගිලි හා ව්‍යුහ, යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව සිදු කරන ලදී.



**වැඩි දියුණු කරන ලද මාර්ග**



**අලුත්වැඩියා කරන ලද පැළ ගෘහය**

### 6.4.4 ජාතික ශාකාගාරයේ සාමාන්‍ය නඩත්තු කටයුතු, අලුත්වැඩියාව සහ මිලදී ගැනීම්

විද්‍යාගාරයට අවශ්‍ය රසායන ද්‍රව්‍යය සහ නිදර්ශක ගබඩා කිරීම සඳහා ශීතකරණයක් මිලදී ගන්නා ලදී. විද්‍යාත්මක අධ්‍යයනයන් සිදු කිරීමට අවශ්‍ය අත්කාච, අන්වික්ෂ වැනි විද්‍යාගාර උපකරණ මිලදී ගන්නා ලදි. ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කිරීම සහ වැසිකිලි නව පෙනුමකින් අලුත්වැඩියා කර ඇත.

### 6.4.5. වන ඖෂධ උද්‍යානය, ගනේවත්ත

භූමි වැඩි දියුණු කිරීම, මාර්ග සංවර්ධනය, ගොඩනැගිලි ඉදිකිරීම කටයුතු මගින් , උද්‍යානයේ දර්ශනිය බව ඉහල නැංවීමට කටුයතු කරන ලදි.

ප්‍රධාන මාර්ග වැඩි දියුණු කිරීම සහ අභ්‍යන්තර මාර්ග වැඩි දියුණු කිරීම සිදු කරන ලදී. උද්‍යානයේ වටිනාකමින් යුත් ගස් ආරක්ෂා කිරීම සඳහා තෙවන අදියර යටතේ උද්‍යානය වටා මායිම් වැටක් ඉදි කරන ලදි.



වැඩි දියුණු කළ අභ්‍යන්තර මාර්ග

මෙම වසර තුළදි පැළ ගෘහයේ 2 වන අදියරයේ 95% ක් වැඩ අවසන්ව ඇත. වයඹ පළාතේ පළාත් ඉංජිනේරු කාර්යාලය මගින් නිලධාරි නිළ නිවාසය ඉදිකිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවති.

භූමියේ උපරිම ප්‍රයෝජන ගත හැකි අයුරින් සහ උද්‍යානයේ අලංකාරය වැඩි දියුණු කිරීම සඳහා උද්‍යානයේ සමහර අංගයන්හි භූමි සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත.



පැළ ගෘහයේ දෙවන අදියර

ශාක සමූහ අළුතින් උද්‍යානයට එක් කරමින් සහ පවතින සමූහ වැඩි දියුණු කරමින් ශාක රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. අළුතින් පැළ 458 ක් මෙම අවුරුද්ද තුළදී උද්‍යානයට වෙත එකතු කරන ලද අතර ඉඟුරු, අරත්ත වැනි ඖෂධ පැළෑටි සමූහ වාණිජමය නිෂ්පාදන නිපදවීම සඳහා වගා කර ඇත.

7

# උද්භිද උද්‍යානයන්හි විශේෂ සිදුවීම්

### 7.1. අන්තර්ජාතික සම්මේලන

දකුණු ආසියාතික කලාපය තුළ මානව ක්‍රියාකාරකම් බහුල වනාන්තර පුනරුත්ථාපනය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය අන්තර්ජාතික පාර්ශවයන් සමඟ සහයෝගිතාවයෙන් ජුලි මස 16 -17 දිනවල රාජකීය උද්භිද උද්‍යානයේදී පවත්වන ලදී. මෙය ඇමරිකානු එක්සත් ජනපදයේ යේල් විශ්ව විද්‍යාලය ( Yale University) මඟින් සංවිධානය කරන ලදී. අන්තර්ජාතික විද්වතුන් 2 දෙනෙකු මේ සඳහා සහභාගි වූ අතර, දකුණු ආසියාතික වනාන්තර පුනරුත්ථාපන කටයුතු පිළිබඳ හා නූතන පර්යේෂණ පිළිබඳ සාකච්ඡා කරන ලදී.



ජාත්‍යාන්තර සම්මේලනයක සාකච්ඡා මෙහොතක්

දකුණු ආසියාවේ වන ප්‍රතිෂ්ඨාපනය සම්බන්ධ මෑත කාලීන පර්යේෂණ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ලොව සිටින සුවිශේෂ මහාචාර්යවරුන්, වෘත්තිකයන් ඇතුළු විසි දෙනෙකු මෙම සමුළුව සඳහා සහභාගි වූහ.



අනුරාධපුරය දැයට කිරුළ ප්‍රදර්ශනයට සහභාගි වෙමින්

64 වැනි නිදහස් දිනට සමගාමීව අනුරාධපුරයේදී පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේ භූමි අලංකරණ කටයුතු සිදු කිරීමට දෙපාර්තමේන්තු නිලධාරින් උපදෙස් ලබාදුන් අතර එහි පැළ හා ඒ සම්බන්ධව නිෂ්පාදන ප්‍රදර්ශන කුටියක් පවත්වා ජනතාව වෙත තොරතුරු ලබාදෙන ලදි. .

### 7.2. මල්වගා පර්යේෂණ පිළිබඳ ජාතික සමුළුව

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලයේ සහයෝගිත්වයෙන් 2012 වර්ෂයේ දෙසැම්බර් 17 දින මල් වගා පර්යේෂණ පිළිබඳ ජාතික සමුළුව සංවිධානය කරන ලදි . සමුළුවේදී 2010 සහ 2011 වර්ෂයේදී සමුළු පරිපාටි මුද්‍රණය කර බෙදා හරින ලදි.









විශ්ව විද්‍යාල සිසුන් මෙන්ම විවිධ දෙපාර්තමේන්තුවලට අයත් නිලධාරින් සහ පෞද්ගලික අංශයේ නිලධාරින් මල්වගා කර්මාන්තය පිළිබඳව පර්යේෂණ පත්‍රිකා 16 ක් 2012 වර්ෂයේ මල්වගා පර්යේෂණ පිළිබඳව ජාතික සමුළුවේදී ඉදිරිපත් කරන ලදි.

### 7.3. අනෙකුත් ක්‍රියාකාරකම්

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ උපන්දිනය සැමරීමට සමගාමීව සංවිධානය කළ " දැයට සෙවන" වැඩසටහන යටතේ 2012 නොවැම්බර් 16 දින පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ගඟ අසබඩ *Dendrocalamus hookeri* පැළ සියයක් සිටුවන ලදි.

සුදු හා රෝස පැහැති ඕළු ලංකා පොකුණේ අලුතින් සිටුවන ලද අතර ඕකිඩ් ගෘහයට සමීපව පිහිටි පොකුණට කුමුදු පැළ එක් කරන ලදි.

ගන්නෝරුව ජාතික කෘෂිකර්ම ප්‍රදර්ශනයට දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහභාගි වූ අතර, එහිදි මල් හා මල් වගාව පිළිබඳ තොරතුරු වගාකරුවන්ට ලබාදෙන ලදි.



**දැයට සෙවන පැළැටි රෝපණ වැඩසටහන**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු මධ්‍යස්ථානයේ සහ ලබුදුව ගොවිපලේ පැවති " දක්ෂිණ නවෝදය " ප්‍රදර්ශනයේදී ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවෙන් ප්‍රදර්ශන කුටියක් ගම්පහ උද්භිද උද්‍යානයේ මල්වගා අංශයේ නිලධාරින් විසින් සංවිධානය කර පවත්වන ලදි .

නුවරඑළිය වසන්ත උත්සවයේ මල් දැක්මේ තරග තීරකයන් වශයෙන් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු නිලධාරින් සහභාගි විය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වසර සියයක් පිරීම නිමිත්තෙන් ගන්නෝරුවේදී පැවැත්වූ ප්‍රදර්ශනය සඳහා ජාතික උද්භිද උද්‍යානය වෙනුවෙන් ප්‍රදර්ශන කුටියක් දෙපාර්ත මේන්තු නිලධාරින් විසින් සංවිධානය කර පවත්වන ලදී.

8

# දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක උපදේශාත්මක වැඩසටහන්

**8.1. උද්‍යාන භූමි අලංකරණය පිළිබඳ උපදේශන වැඩසටහන්**

උද්‍යාන භූමි අලංකරණය පිළිබඳ උපදේශාත්මක වැඩසටහන් කිහිපයක් විවිධ ආයතන සඳහා ක්‍රියාත්මක කරන ලදි. එම ආයතන ලැයිස්තුව පහතින් දැක්වේ.

- නියෝජ්‍ය ඉන්දියානු මහකොමසාරිස් නිළ නිවස - මහනුවර
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය
- සංචාරක නිකේතනය - පාසිකුඩා
- බන්ධනාගාරය - පල්ලේකැලේ
- හරිත පියස පුහුණු මධ්‍යස්ථානය - මීගලැව
- පරිපාලන හා සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය - පිළිමතලාව

එමෙන්ම රාජකීය උද්‍යානයේ නිලධාරින් හම්බන්තොට උද්‍යානය භූමි සංවර්ධන කටයුතු සඳහා ඔවුන්ගේ විශේෂඥ දැනුම ලබා දුන් අතර, උද්‍යානයේ භූමි අලංකරණ හා උද්‍යාන අලංකරණයට ද දායකත්වය ලබා දී ඇත.

ගම්පහ උද්භිද උද්‍යානයේ නිලධාරින් විසින් හෙනරත්ගොඩ දුම්රිය ස්ථානයේ සංරක්ෂණ ව්‍යාපෘතිය, පිල්ලිකුට්ටුව පූජනීය භූමි සංවර්ධන ව්‍යාපෘතිය, ගම්පහ රෝහලේ භූමි සංවර්ධන ව්‍යාපෘතිය සහ දැදුගම් ඔය ව්‍යාපෘතිය සඳහා සහය ලබාදෙන ලදී.

මීට අමතරව පලාත් අධ්‍යාපන කාර්යාල භූමි භාගය, මීනුවන්ගොඩ/කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය, කැප්පෙටිපොල මහා විද්‍යාලිය භූමි භාගය, මිනුවන්ගොඩ / ගම්පහ යශෝධරා දේවි බාලිකා විද්‍යාලය සහ ගම්පහ සහ කඩවත මහේස්ත්‍රාත් උසාවි සංකීර්ණභූමි අලංකාරය සඳහා ද තාක්ෂණික උපදෙස් ද ලබා දෙන ලදි.

**8.2. මල්වගාව සම්බන්ධ තොරතුරු ලබාදීම**

වාණිජමය මල් වගාව, තවාන් පාලනය, පලිබෝධ සහ රෝග කළමනාකරණය ආශ්‍රිත පැන නැගුණු ගැටළු සඳහා සහ ක්ෂුද්‍ර ප්‍රචාරණය ව්‍යාප්ත කිරීම සම්බන්ධව පුද්ගලයින් 896කට අය කිරීමකින් තොරව උපදේශනය ලබාදෙන ලදි.. ඕකිඩ් සහ ඇන්තූරියම් පිළිබඳ ව්‍යාපෘති පවත්වාගෙන යාමට පාසැල් ළමුන් 62 ක් සඳහා පහසුකම් ද සලසා දෙන ලදි.

**8.3. බාහිර පුද්ගලයින් සඳහා උද්භිද විද්‍යාත්මක තොරතුරු වල සත්‍ය බව සහතික කිරීම සහ උද්භිද විද්‍යාත්මක තොරතුරු මිනිසුන් අතර ව්‍යාප්ත කිරීම**

උද්භිද උද්‍යාන මඟින් මහජනතාවට, සිසුන්හට සහ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වලට අවශ්‍ය වූ විට දී උද්භිද විද්‍යාත්මක තොරතුරු ලබාදීමට කටයුතු කරයි.

ශාකාගාර ක්‍රම වේද සහ කළමනාකරණය මෙන්ම පර්යේෂණ අරමුණු සඳහා විවිධ තොරතුරු හා දැනුම ලබා ගැනීමට විවිධ ආයතනවලින් විදේශිකයින් 42 ක් ද දේශියයන් 1,116 (පාසැල් ළමුන්, විශ්ව විද්‍යාල සිසුන් ) ක් ද ශාකාගාරය නැරඹීමට පැමිණියහ.

මහජනයා සහ සෙසු ආශ්‍රිත පාර්ශව විසින් උද්භිද විද්‍යාත්මක තොරතුරු ඉල්ලීම් කළ ලියුම් 81 ක් සඳහා පිළිතුරු යවන ලදි.

රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සඳහා පැළෑටි නිදර්ශක1,183, මීවන නිදර්ශක 103 ක් සහ බ්‍රියෝෆියට් ( Bryophyte) නිදර්ශක 05 ක් හදුන්වා ගන්නා ලදි.

නේචර් සීක්‍රට්ස් ශාක පර්යේෂණ මධ්‍යස්ථානය මගින් සිදු කරන ලද ආයුර්වේද ශාක නිස්සරාන අධ්‍යයයනයන් සඳහා ශාක නිදර්ශක 18 ක් සඳහා ඒවා සහතික කර වවුචර නිදර්ශක වශයෙන් තැන්පත් කරන ලදි.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂක සිසුන් විසින් එක්රැස් කළ *Crotalaria juncea* නිදර්ශක වවුචර් වශයෙන් තැන්පත් කරන ලදි.

හෙට්ටිගොඩ කර්මාන්තායතනය මගින් සංවිධානය සිදු කළ ආයුර්වේද ශාක නිස්සාර අධ්‍යනයක් සඳහා ශාක නිදර්ශක 10 ක් සහතික කර වවුචර් නිදර්ශක වශයෙන් තැන්පත් කර ඇත.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි සිසුවෙකු විසින් එක් රැස් කළ *Taraxacum javanicum* නිදර්ශක දෙකක් සහතික කර වවුචර් නිදර්ශක වශයෙන් තැන්පත් කර ඇත. *Cymbopogon nardus* නිදර්ශකයන් හන්තාන පදනම් ආයතනය වෙත ඉදිරිපත් කර සත්‍ය බව සහතික කර ගන්නා ලදී.

කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි සිසුවෙකු විසින් එක්රැස් කළ *Psychotria sarmentosa* නිදර්ශකයන් සත්‍ය බව සහතික කර ශාකාගාරයේ තැන්පත් කරන ලදී.

වනජීවි දෙපාර්තමේන්තුවෙන් භාරදෙන ලද දැව සාම්පල *වන Santalum album නිදර්ශක කාව* 56 ක් සහ *Gyrinops walla* නිදර්ශක කාව 12 ක් නීතිමය කටයුත්තක් සඳහා තහවුරු කර ගැනීම සඳහා සකසා දෙන ලදී.

9

# සෙසු ඒකකවල සංවර්ධන ක්‍රියාකාරකම් / වැඩසටහන්

## 9.1. අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිළ නිවාස

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ 01 පිහිටි අරලියගහ මන්දිරය, මහනුවර, නුවරඑළිය, අනුරාධපුරය පිහිටි මන්දිර උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ කොළඹ සහ නුවරඑළියේ පිහිටි නිළ නිවාසබද උද්‍යාන උසස් ලෙස නඩත්තු කරන ලදී .

අතිගරු ජනාධිපතිතුමාගේ සහ අතිගරු අගමැතිතුමාගේ නිළ නිවාසබද උද්‍යානවල අලංකාරය වැඩි කිරීම සඳහා සංවර්ධන කටයුතු දියත් කරන ලදී.



අරලියගහ මැදුර උද්‍යානයේ එළවළු සහ පළතුරු වැවී ඇති අයුරු

මෙම උද්‍යානවල අභ්‍යන්තර අඩි පාරවල් වැඩිදියුණු කර ඇති අතර, සමහර අංග ද වැඩි දියුණු කර ඇත. මල් තීරු, මල් පාත්ති සහ එළවළු පාත්ති එක් කිරීමෙන් සියළුම උද්‍යානවල භූමි අලංකරණය වැඩි දියුණු කර ඇත. .

අතිගරු අගමැතිතුමාගේ කොළඹ පිහිටි නිළ නිවාස උද්‍යානයේ දර්ශනීය බව ඉහල නැංවීම සඳහා නව ව්‍යුහයන් එක් කර ඇත.

භූමි අලංකරණය හා උද්‍යානයේ භාවිතය සඳහා උපකරණ හා යන්ත්‍ර මිලදී ගන්නා ලදි. මල් , එළවළු සහ පළතුරු පැළ තවාන්වල සාර්ථකව නඩත්තු කොට නිල නිවාසවල එදිනෙදා අවශ්‍යතා සඳහා සපයන ලදී.



අතිගරු ජනාධිපතිතුමාගේ නිළ නිවාස උද්‍යානයේ පළතුරු වැවී ඇති අයුරු

අතිගරු ජනාධිපතිතුමාගේ මහනුවර පිහිටි නිළ නිවාසයේ පිහිටි දිරා ගිය ගස් ඉවත් කළ අතර, වැටුණු ගස් ද ඉවත් කරන ලදි. අතිගරු ජනාධිපතිතුමාගේ නුවරඑළියේ පිහිටි නිළ නිවාසයේ රෝස උයන වැඩි දියුණු කර ඇත. අතිගරු අගමැතිතුමාගේ නුවරඑළියේ පිහිටි නිළ නිවාසයේ ද්වීත්ව ස්වභාවික පොකුණු සහ පොලිතින් ගෘහ අලුත්වැඩියා කරන ලදී.

## 9.2. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක

දෙවන ලෝක යුද්ධයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය යුද හමුදා සේවයට අයත් නිලධාරින් සිහිවීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකකය පවත්වාගෙන යයි .

මෙම වසර තුළදී මහනුවර, ජාවත්ත, බොරුල්ල සහ ත්‍රිකුණාමලයේ පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක ඉහල තත්ත්වයකින් නඩත්තු කරන ලදී.

යුධ සොහොන් ඒකකවල ක්‍රියාකාරකම් පහත පරිදි පවත්වාගෙන යන ලදී. ජාවත්ත යුධ සොහොන් ඒකකයේ තණ පිඩැලි නැවත ස්ථාපිත කිරීම සහ බොරුල්ල යුධ සෙහොන් ඒකකයේ බිමෙහි **Zoysia** තෘණ පිඩැලි ඇතිරීම , බොරුල්ල යුධ සොහොන් ඒකකයේ **Zoysia** තෘණ සමග තෘණ පිඩැලි සහිත භූමිය පිලිසකර කිරීම කරන ලදී. ජාවත්ත යුධ සොහොන් ඒකකයේ මායිම් ගල් අතුරා සම්පූර්ණ කර ඇත. පොදු රාජ්‍ය මණ්ඩලීය කොමිසමෙන් නව ස්කොඩ් කටර් යන්ත්‍ර සහ හෙජ් කටර් යන්ත්‍ර ලබා ගන්නා ලදී. මහනුවර යුධ සොහොන් ඒකකයේ පාංශු ඛාදනය වැළැක්වීමට සැලසුම් කර ඇත. ත්‍රිකුණාමලය යුධ සොහොන් ඒකකයේ සන්ටානා තෘණ යොදා ගනිමින් **(*Cynodon dactylon)*** තෘණ පිඩැලි සහිත භූමිය සකස් කරන ලදී.

ත්‍රිකුණාමල පිහිටි යුධ සෙහොන් එකකය මෙහෙයවීමේ වගකීමේ කටයුතු වර්නින් (Mr. Worthing) මහතාගෙන් ඉවත් කර, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට මෙම වර්ෂයේදී පවරන ලදී. ගැටළු සහගත කාල පරිච්ඡේදයේදී වර්නින් මහතා විසින් යුධ සොහොන් ඒකකය බලා ගන්නා ලදි.



මහනුවර යුධ සොහොන් ඒකකය



ජාවත්ත යුධ සොහොන් ඒකකය



**ජාවත්ත යුධ සොහොන් ඒකකයේ තණපිඩැලි ඇල්ලීම් කටයුතු**



**ත්‍රිකුණාමලය යුධ සොහොන් ඒකකය**

### 9.3 උද්‍යාන භාරකාර අරමුදල

උද්භිද උද්‍යාන සංවර්ධනය සහ සුභ සාධනය සඳහා වූ උද්භිද උද්‍යාන භාරකාර අරමුදල 1996 පෙබරවාරි 07 දින කැබිනට් අනුමැතියෙන් ආරම්භ කරන ලද අතර, එය 1995 දෙසැම්බර් 15 වැනි දින කෘෂිකර්ම , ඉඩම් සහ වන සම්පත් ඇමති වෙත ඉදිරිපත් කරන ලද කැබිනට් සටහන් පත්‍රිකාව සැලකිල්ලට ගනිමින් සිදු කෙරිණි.

උද්භිද උද්‍යානවල වාර්ෂික ආදායමෙන් 25% උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම සහ එහි සුභ සාධනය සඳහා උද්‍යාන භාරකාර අරමුදල වෙත වෙන් කිරීමක් වන අතර, මෙය මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ.

උද්භිද උද්‍යානවල සංවර්ධන කටයුතු සඳහා මුල්‍යමය ආධාර සැපයීම මෙම අරමුදලේ ප්‍රධාන අරමුණු වේ ;

- උද්භිද උද්‍යාන පිළිබඳ ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශ රටවල ද ප්‍රවර්ධනයට කටයුතු කිරීම
- අධ්‍යාපන වැඩසටහන් සහ පැළෑටි සංරක්ෂණය ක්‍රියාත්මක කිරීම
- පහසුකම් වැඩි දියුණු කිරීම සහ උපකරණ මිලදී ගැනිම සඳහා මුල්‍යමය ආධාර සැපයීම
- ශාක එකතුන් සම්බන්ධව ක්‍රමවත් වැඩසටහන් ඇති කිරීම
- උද්භිද උද්‍යානවල සංවර්ධනය මෙන්ම තාක්ෂණික, අධ්‍යාපනික සහ පුහුණු ක්‍රියාදාමයන් වැඩිදියුණු කිරීම සඳහා මුල්‍යමය ආධාර සැපයීම
- උද්භිද උද්‍යානයට පැමිණෙන විද්‍යාඥයින් සහ විශේෂ නියෝජිතයින් සඳහා පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය වූ විට කඩිනමින් කටයුතු සිදු කිරීම
- විශේෂ වැඩසටහන් සඳහා ඉදිකිරීම් පුනරාවර්තන වැය ආවරණය කිරීම

**2012 වසරේදී සිදුකල සංවර්ධන ක්‍රියාකාරකම්**

| | සංවර්ධන ක්‍රියාදාමයන් | ඒකකය |
|---|---|---|
| 1. | උද්භිද උද්‍යානවල තත්ත්වය ඉහල නැංවීම සඳහා උද්භිද උද්‍යාන අලංකරණ කිරීමේ ක්‍රියාකාරකම් සහ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරකම් සිදු කිරීම | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය,<br>හක්ගල උද්භිද උද්‍යානය,<br>ගම්පහ උද්භිද උද්‍යානය |
| 2. | අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම | -එම - |
| 3. | කම්කරු නිළ නිවාස අලුත්වැඩියා කිරීම සහ කම්කරුවන් සඳහා වැඩපොළ ඉදි කිරීම. කම්කරුවන් සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය, |
| 4. | විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම | ජාතික ශාකාගාරය |
| 5. | විද්‍යාත්මක ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා රසායනාගාර උපකරණ මිලදී ගැනීම | -එම- |
| 6. | නව පැල වර්ග මිලදී ගැනීම | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය,<br>හක්ගල උද්භිද උද්‍යානය, |
| 7. | නව ග්‍රන්ථ සහ තොරතුරු මුද්‍රණ ද්‍රව්‍යය මිලදී ගැනීම | ජාතික ශාකාගාරය<br>රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය, |
| 8. | අධ්‍යාපන මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම | රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය, |
| 9. | ශාකාගාරයේ වහලය අලුත්වැඩියා කිරීම | ජාතික ශාකාගාරය |

භාරකාර අරමුදලේ 2012 වර්ෂයේ වාර්ෂික භාරකාර අරමුදල් ප්‍රතිපාදන රුපියල් මිලියන 81.9 වන අතර රුපියල් මිලියන 79.2 (97%) මෙම වසරේ උද්භිද උද්‍යාන සංවර්ධනය සඳහා යොදා ගන්නා ලදි .

**9.4. මීගලෑව - හරිත පියස**

වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හැතැප්ම 60ක පමණ දුරකින් මීගලෑව හරිත පියස පිහිටා ඇත. හරිත පියසෙහි වර්ග ප්‍රමාණය අක්කර 6 කි. මෙම ඉඩම 2008 වර්ෂයේදී මහවැලි අධිකාරියට අයත්ව තිබූ අතර, පුහුණු සහ ශාක නිෂ්පාදනය සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව අයත් රේඛීය අමාත්‍යාංශය වෙත පවරා ගන්නා ලදී. මීගලෑව හරිත පියසේ සංවර්ධන ව්‍යාපෘතියේ කාර්යයන් 2011 වර්ෂයේ ආරම්භ කළ අතර 2012 වර්ෂයේදී ද ක්‍රියාත්මක විය.

ජලසම්පාදන ක්‍රමය ස්ථාපනය කිරීමේ කටයුතු මෙම වසරේදී ආරම්භ කළ අතර, ළිදක් සහ ජල සම්පාදන පද්ධතියක් ඇති කරන ලදී. ඊලඟ වසරේදී සිදු කිරීමට බලාපොරොත්තු වන සංවර්ධන ක්‍රියාකාරකම් ඇස්තමේන්තු ගත කර ඇත.

10

## පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම

අලුතින් විද්‍යාත්මක ග්‍රන්ථ මිලදී ගන්නා ලද හා අධ්‍යයන කටයුතු සඳහා පුස්තකාලයට එක් කරන ලදී.

1. රණසිංහ, ඩී.බී. 2011. Sojourns in vanishing jungles in Sri Lanka. එන්ඩීටී සමාගම, 27/68, විජය පාර, කොළොන්නාව.
2. සේනානායක,ආර්. 2010. Exotic medicinal plants in Sri Lanka and their uses. 1 වෙළුම, නියෝප්‍රින්ටර්ස්, ශ්‍රී ලංකා.
3. ගුණසේකර, එල්. Invasive Plants. මුද්‍රණ සහ මුද්‍රණ ගැෆික් පුද්ගලික සමාගම , මාලිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකා.
4. මිස්රා, එස්. 2004. Orchids of Orissa. බිෂන් සිං මහේන්ද්‍ර පෝල් සිං , දෙහෙරා දූං, ඉන්දියාව.
5. මිස්රා, එස්. 2007. Orchids of India. බිෂන් සිං මහේන්ද්‍ර පෝල් සිං, දෙහෙරා දූං, ඉන්දියාව.
6. ප්‍රාසර් ජෙංකිංස් සී.ආර්. 1977. New species syndrome in Indian pteridology and the ferns of Nepal. ජාත්‍යාන්තර පොත් බෙදා හරින්නෝ, දෙහෙරා දූං, ඉන්දියාව.
7. RHS Colour Chart 2007 5වැනි මුද්‍රණය. The Horticulturist Society, තැ.පෙ 313. එංගලන්තය

**11**

# කාර්ය මණ්ඩල මාරුවීම, විශ්‍රාම ගැනීම, උසස් වීම් සහ පුහුණුව

### 11.1 රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය

ශ්‍රීමති මඩවල මිය අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයට සේවා අවශ්‍යතා සඳහා 2012 ජුලි 23 මාරු කරන ලදි.

කේ.එම්. සෙනෙවිරත්න බණ්ඩා මයා (ගස් කපන්නා) ගම්පහ උද්භිද උද්‍යානය වෙත 2012 අගෝස්තු 23 මාරු කරන ලදි.

ගාස්තු අයකිරීමේ සහකාර යූ. විමලසේන මයා 2012 මාර්තු 11 දින විශ්‍රාම ගන්නා ලදි.

කම්කරු ඩී. චන්ද්‍රරත්න පෙරේරා මයා සහ පී.ජී. ධර්මසේන මයා පිළිවෙලින් 2012 මාර්තු 29 සහ 2012 අප්‍රේල් 10 විශ්‍රාම ගන්නා ලදි.

සුනිල් වීරසිංහ මයා (පෙදරේරු) 2012 ජුලි 01 දින විශ්‍රාම ගන්නා ලදි.

කළමනාකරණ සහකාර මල්කාන්ති රත්නායක මිය අරුප්පල කාර්මික විද්‍යාලයේ පරිපාලන නිලධාරි වශයෙන් උසස්වීමක් ලැබ 2012 ජුලි 23 දින දෙපාර්තමේන්තුවෙන් මාරු වෙන ලදී.

### 11.2. මල්වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

අයි.ඩබ්.එම්. කරුණාරත්න මයා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත මාරුවෙන ලදී. නිමාලි පෙරේරා (උපාධිධාරි අභ්‍යාසලාභි ) මිය කෑගල්ල දිස්ත්‍රික්කයේ මල්වගා ව්‍යාපෘතිය හා සම්බන්ධ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සඳහා ඒකකය වෙත එක්වෙන ලදි.

### 11.3. ජාතික ශාකාගාරය

එච්.එම්.යූ. වීරසේකර (කම්කරු III ශ්‍රේණිය) මයා මල්වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකය වෙත මාරු කරන ලදි

### 11.4. හක්ගල උද්භිද උද්‍යානය

කළමනාකරණ සහකාර එස්.ආර්. තන්ත්‍රිගේ මිය 2012 ඔක්තෝම්බර් 22 දින මාරුවීමක් ලබන ලදි .

ඒ. මාගලිංගම් මයා 2012 සැප්තැම්බර් 13 විශ්‍රාම ගන්නා ලදි.

### 11.5. ගම්පහ උද්භිද උද්‍යානය

ජී.එල් ස්වර්ණලතා මිය (කම්කරු III ශ්‍රේණිය) විශ්‍රාම ගන්නා ලදි .

කේ.එල් ධර්මදාස මිය මාරුවීමක් ලැබ උද්‍යානයේ වැඩ හැර යන ලදී.

කළමනාකරණ සහකාර III සී.එස්. තේනුවර මිය කේ.ඩී.අයි. අමරසිංහ මයා සමඟ සුහද මාරුවීමක් ලද අතර අමරසිංහ මිය උද්‍යානයේ වැඩ භාර ගන්නා ලදී .

**11.6 කාර්ය මණ්ඩල සඳහා පුහුණුවීම්**

| | විස්තරය | ආයතනය | රට | පුහුණු වූ කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| 1 | ගෘහ පාලනය,<br>ආහාර සහ පානීය වර්ග | ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය සහ හෝටල් කළමනාකරණ ආයතනය | ශ්‍රී ලංකාව | උද්භිද උද්‍යානවල සංචාරක බංගලා භාරකරුවන් |
| 2 | පොදු ප්‍රසම්පාදන ක්‍රමවේද | නිපුණතා වර්ධන අරමුදල, නිපුණතා පියස | ශ්‍රී ලංකාව | ගම්පහ උද්භිද උද්‍යාන සංරක්ෂණ සහ සහකාර අධ්‍යක්ෂ /සුවහස් මල් වැඩසටහන |
| 3 | ලේකම්වරු සම්බන්ධ පුහුණුව | නිපුණතා වර්ධන අරමුදල, නිපුණතා පියස | ශ්‍රී ලංකාව | අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ලේකම්තුමිය |
| 4 | ලංසු ඇගයුම | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | ශ්‍රී ලංකාව | ගම්පහ සහ පේරාදෙණිය උද්භිද උද්‍යානවල උද්‍යාන සංරක්ෂකවරුන් |
| 5 | මහජන මුදල් කළමනාකරණය පිළිබඳ මූල්‍යමය නොවන කළමනාකරුවන් සඳහා පුහුණුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | ශ්‍රී ලංකාව | ගම්පහ උද්භිද උද්‍යානයේ උද්‍යාන සංරක්ෂක |
| 6 | අප ජලය එකතු කිරීම, පිරිපහදුව සහ බැහැර කිරීම් ක්‍රම හා ජල මාර්ග කළමනාකරණය | ICTAD (ඉක්ටැඩ්) | ශ්‍රී ලංකාව | සිවිල් ඉංජිනේරු |
| 7 | ඵලදායිතා සංකල්ප සහ ක්‍රියාකාරකම් | ජාතික කම්කරු අධ්‍යයන ආයතනය | ශ්‍රී ලංකාව | කළමනාකරණ සහකාරවරුන් 04 දෙනෙකු |
| 8 | වැටුප් පරිවර්තනය කිරීමේ පුහුණුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | ශ්‍රී ලංකාව | කළමනාකරණ සහකාරවරුන් 03 දෙනෙකු |
| 9 | ලිපිගොනු කළමනාකරණය කිරීමේ පුහුණුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | ශ්‍රී ලංකාව | කළමනාකරණ සහකාරවරුන් 02 දෙනෙකු |

- අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානයේදී, මල්වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකහි, ගම්පහ, හම්බන්තොට, පේරාදෙණිය උද්භිද උද්‍යානයෙහි සහ කොළඹ සුවහස් මල් වැඩසටහන් කාර්යාලයෙහි කම්කරුවන් 75 ක් සහ නිලධාරීන් සඳහා එක් දින වැඩමුළුවක් පවත්වන ලදි.

- අපනයන සංවර්ධන මණ්ඩලයේ පුද්ගලයින් 150 ක් සඳහා සංවිධානය කළ සම්මන්ත්‍රණයක් සඳහා සම්පත්දායකයෙකු වශයෙන් මල්වගා පර්යේෂණ සහ සංවර්ධන අංශයේ ප්‍රියන්ත වැලිකුඹුර මයා සහ කේ.ඒ.සී.එන් සෙනෙවිරත්න මිය ද ගම්පහ උද්භිද උද්‍යානයේ එම්.සී. වික්‍රමසිංහ මිය ද සහභාගී වූහ.

- ගම්පහ මල්වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකයේ නිලධාරීන් විසින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙනුවෙන් " දක්ෂිණ නවෝදය " ප්‍රදර්ශනයේදී ප්‍රදර්ශන කුටියක් පවත්වන ලදි.

- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික සේවාස්ථ පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.

12

## 2012 වර්ෂයේදී ප්‍රකාශනයට පත් වූ පර්යේෂණ පත්‍ර

1. වීරරත්න, ටී. ජී., ඩබ්. ඒ. එම්. ඩවුන්දසේකර සහ **ඩී.එස්.ඒ. විජේසුන්දර** (2012) Field survey of postharvest handling of cut flowers produced in the Up country of Sri Lanka for the local market . *ශ්‍රී ලංකා විද්‍යා ජ'නලය* (*ජීව. විද්‍යා.*) 41 (1): 67-70, 2012.

2. කාර් ගාවිං, ඩේවිඩ් ඊ.විලියම්ස්, රුක්මාල් රත්නායක, රත්නායක බණ්ඩාර, **සිරිල් විජේසුන්දර,** වමිසිං වාලිං, අරුණ ඩී බල්ගි, මයිකල් රොබර්ජ්, රේමන්ඩ් ජේ ඇන්ඩර්සන්, සහ වෙරංජා කරුණාරත්න (2012) Hortonones A to C, Hydroazulenones from the Genus Hortonia. ස්වාභාවික නිෂ්පාදන පිළිබඳ ජ'නලය. 75(6):1189-91.

3. ජයලාල්, උදේනි පට් වෝල්ස්ලි, සිසිලි ගයිඩාං, ඇන්ඩෘ අප්ටුර්ට්, **සිරිල් විජේසුන්දර** සහ වෙරංජා කරුණාරත්න 2012. Anzia mahaeliyensis and Anzia flavotenuis, two new lichen species from Sri Lanka. ලයිකන් විද්‍යාඥයා 44(3): 381–389

4. රාජපක්ෂ, සනත්, ප්‍රභාෂිනි ඉද්දමල්ගොඩ, රුක්මාල් රත්නායක, **ඩී.එස්.ඒ. විජේසුන්දර,** බී.එම්. රත්නායක බණ්ඩාර සහ වෙරංජා කරුණාරත්න. 2012. Evaluation of species limits of Hortonia by DNA barcoding. ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම ජ'නලය ශ්‍රී ලංකා. වෙළුම. 40. අංක 4. 345-349

5. සෙනෙවිරත්න කේ. ඒ. සී. එන්., එම්. ඩවුන්දසේකර, **ඩී. එස්. ඒ. විජේසුන්දර,** එස්. ඒ. කුලසූරිය, බී. වී. ආර්. ඒ. කේ. ජයරත්න, **එස්. ඒ. ක්‍රිෂ්ණරාජා, කේ. එන්. යාපා;** Identification of causal organisms of diseases and effect of growing media on disease severity on the export oriented foliage plant *Zamioculcas zamifolia* (Lodd.) Engl. ජාතික විද්‍යා පදනමේ ජ'නලයේ ප්‍රකාශනයට පත් කිරීම සඳහා ඉදිරිපත් කර ඇත.

6. බණ්ඩාරනායක සී. යූ. ආර්., **එස්. ඒ. ක්‍රිෂ්ණරාජා** සහ එස්. ඊ. පිරිස්; Investigation of the most effective fertilizer combination for sucker formation and growth of *Chlorophytum comosum* L. (Spider plant) මල්වගා පර්යේෂණ ජාතික සමුළුව 2012 දී ඉදිරිපත් කරන ලද අතර ප්‍රකාශයට පත් කර ඇත.

7. මදුරුසිංහ එම්. ඒ. ඩී. එන්., **එස්. ඒ. ක්‍රිෂ්ණරාජා** සහ යසරත්න අමරසිංහ; Effect of BAP and IAA on *in-vivo* Sucker Formation and Plant Development of Spider Plant (*Chlorophytum comosum* L.) මල්වගා පර්යේෂණ ජාතික සමුළුව 2012 දී ඉදිරිපත් කරන ලද අතර ප්‍රකාශයට පත් කර ඇත.

8. වීරසේකර ඩබ්. ඒ. සී. එස්., එස්. ඊ. පිරිස්, කේ. ඒ. සී. එන්. සෙනෙවිරත්න, **එස්. ඒ. ක්‍රිෂ්ණරාජා සහ කේ. එන්. යාපා;** Effect of Chemical Treatments on Extending the Vase Life of *Ophiopogon intermedius* L., *Ophiopogon japanicus* L. and *Calathea lousiae* L. මල්වගා පර්යේෂණ ජාතික සමුළුව 2012 දී ඉදිරිපත් කරන ලද අතර ප්‍රකාශයට පත් කර ඇත.

9. **රාජමන්ත්‍රී ආර්. ජී. එල්. එන්., එච්. එම්. අයි.** හේරත් සහ යසරත්න අමරසිංහ **;** Development of a Micropropgation Protocol for Bird's Nest Anthurium (*Anthurium hookeri*) මල්වගා පර්යේෂණ ජාතික සමුළුව 2012 දී ඉදිරිපත් කරන ලද අතර ප්‍රකාශයට පත් කර ඇත.

10. දසනායක **ඩී. එම්. අයි. සී. බී., එම්. කේ.** රූබසිංහ සහ **ඩී. අයි. එම්.** අමරරත්න; Modification of Plant Architecture of Heen-Bovitiya (*Osbeckia octandra*) මල්වගා පර්යේෂණ ජාතික සමුළුව 2012 දී ඉදිරිපත් කරන ලද අතර ප්‍රකාශයට පත් කර ඇත.

11. **අත්තනායක, ඒ. එම්. ඒ. එස්.**, අයි. එම්. ටර්නර් සහ ආර්. එම්. කේ. සවුංඩර්ස් **(**2011). Two new species of *Uvaria* (Annonaceae) from Borneo, with a new nomenclatural combination. *Novon* 21**:** 161-168.

12. **විජේසුන්දර ඩී.එස්.ඒ.**, එච්.එස්. කත්‍රිආරච්චි, **එස්.ඩබ්. රණසිංහ** සහ හපුආරච්චි එච්., **(**2012**).**Analysis of Seed Plants of Sri Lanka. In: ජාතික රතු දත්ත නාමාවලිය 2012 of Sri Lanka; Conservation Status of the fauna and flora. වීරකෝන්, ඩී.කේ. සහ **එස්. විජේසුන්දර** Eds., පරිසර අමාත්‍යංශය, කොළඹ, ශ්‍රී ලංකා. පිටුව. 340-345.

13. විජේසේකර ජී.ඒ.ඩබ්., **එස්. විජේසුන්දර** සහ **එස්. රණසිංහ** (2012/2011). Food Crop Wild Relatives in Sri Lanka. In: The Sri Lanka Forester (The Ceylon Forester), Vol. 32 & 33, ISSN 0258-624X, ශ්‍රී ලංකාවේ වන සම්පත් දෙපාර්තමේන්තුව,පිටුව. 81-107.

14. **එස්. විජේසුන්දර (**2012**) .**Present Status of Montane Forests in Sri Lanka. In: ශ්‍රීලංකාවේ ජාතික රතු දත්ත නාමාවලිය 2012; Conservation Status of the fauna and flora. වීරකෝන්, ඩී.කේ. සහ **එස්. විජේසුන්දර** Eds., පරිසර අමාත්‍යංශය, කොළඹ, ශ්‍රී ලංකා. x-y පිටුව

13

## 2013 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම

| මහින්ද චින්තන වැඩසටහන | සැළසුම් කරන ලද ක්‍රියාකාරකම් |
|---|---|
| පාරිසරික සංරක්ෂණය සහ පරිසර හිතකාමී සංචාරක ප්‍රවර්ධනය | පහතරට වියළි කළාපීය ශාක සංරක්ෂණය කිරීම සඳහා ආරම්භ කරන ලද මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු දිගටම පවත්වාගෙන යාම:<br>1. නරඹන්නන්හට පහසුකම් ලබා දීම සඳහා , ප්‍රධාන පිවිසුම් සංකීර්ණය, රථගාල, උයන් කුටි සහ වැසිකිලි, පානීය ජල ක්‍රමය ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම.<br>2. මාර්ග පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීම.<br>3. ප්‍රදේශයේ වටා වචන්නන්හට පහසුකම් සැපයීම සඳහා මල්වගා තවාන් ඇති කිරීම. පාසැල් ළමුන් ඇතුළු මහජනයා සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>4. පැළ සිටුවීම සහ ශාක සංරක්ෂණ වැඩසටහන්.<br>5. භූමි අලංකරණ සංවර්ධන වැඩසටහන්.<br><br>පහතරට තෙත් කලාපීය ශාක සංරක්ෂණය කිරීම සඳහා ආරම්භ කරන ලද අවිස්සාවේල්ල ඉලුක්ඔවිට උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු දිගටම පවත්වාගෙන යාම:<br>1. ප්‍රධාන පිවිසුම් සංකීර්ණය ඉදිකිරීම අවසන් කිරීම.<br>2. අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම.<br>3. උද්‍යානයේ භූමි අලංකරණ ලක්ෂණ වැඩි කිරීම සඳහා භූමි සංවර්ධන ක්‍රියාකාරකම් පවත්වාගෙන යෑම.<br>4. ශාක එකතුව වැඩි දියුණු කිරීම සඳහා ශාක රෝපණ වැඩසටහන් පැවැත්වීම.<br>5. ප්‍රදේශයේ වචන්නන්හට පහුසකම් සැපයීම සඳහා උද්‍යානයේ මල්වගා සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම. |
| ජෛව විවිධත්ව සංරක්ෂණය තහවුරු කිරීම | 1. ලයිකන්, තලස වැනි පහත් ශාක පිළිබඳ අධ්‍යයනය දිගටම පවත්වාගෙන යාම.<br>2. ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳ විතැන් සංරක්ෂණය කටයුතු සිදු කිරීම.<br>3. ඉඟුරු, අරත්ත වැනි ඖෂධ පැළෑටි වාණිජමය නිෂ්පාදනය සඳහා දියුණු කිරීම.<br>4. ගවේෂණය, ශාක නිදර්ශක එකතුව, වියළි සහ තෙත් කලාපීය ප්‍රධාන වශයෙන් තර්ජණයට ලක්වූ ශාක සඳහා උද්භිද විද්‍යාත්මක සමීක්ෂණයක් පැවැත්විම.<br>5. ශාක වර්ගීකරණය, විවිධත්වය හා සෙසු ආශ්‍රිත ප්‍රදේශවල විද්‍යාත්මක අධ්‍යයනය සහ පර්යේෂණ පැවැත්වීම.<br>6. ඓතිහාසික හෝ ආගමික වැදගත්කමකින් යුතු වෘක්ෂ සංරක්ෂණය කිරීම.<br>7. සෑම උද්භිද උද්‍යානයකින් අවම වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණ 10 ක් පැවැත්වීම.<br>8. ශාකාගාර නිදර්ශක පරිගණක ගත කිරීම.<br>9. ශ්‍රී ලංකාවේ ශාක වල ව්‍යුහාත්මක විමර්ශන |

| මහින්ද චින්තන වැඩසටහන | සැළසුම් කරන ලද ක්‍රියාකාරකම් |
|---|---|
| | කටයුතු සිදු කිරීම.<br>10. ශ්‍රී ලංකාවේ දුර්ලභ සහ තර්ජනයට ලක්ව ඇති ශාක වල ක්ෂුද්‍ර ප්‍රචාරණය පිළිබඳව පර්යේෂණ ආරම්භ කිරීම. |
| මල් වගාවේ යෙදෙන්නන්හට අත්‍යවශ්‍ය තාක්ෂණික සහ අනෙකුත් හැකියාවන්ගෙන් සන්නද්ධ කිරීම | 1. මල්වගා සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ වැඩසටහන් පවත්වාගෙන යාම<br>2. මල් වගාකරුවන් ගේ හැකියාව වැඩි කිරීමට පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම<br>3. මල් වගාකරුවන්ගේ අලෙවි හැකියාව වැඩි කිරීම සඳහා ප්‍රදර්ශන සංවිධානය කිරීම<br>4. වවන්නන්හට අලුත් වර්ගවල උසස් ගුණයෙන් සහ වටිනාකමින් යුත් මව් ශාක හඳුන්වා දීම<br>5. " සුවහස් මල් වැඩසටහන" යටතේ වවන්නන්ගේ පැළ තවාන්වලට ගොස් ක්ෂේත්‍රයේදී ඔවුන්ට පැන නගිනා ගැටළුවලට ක්ෂේත්‍ර උපදෙස් ලබා දීම<br>6. උද්භිද උද්‍යානවල බාහිරව ද මල් වගාව, පරිසර සංරක්ෂණය පිළිබඳ ප්‍රදර්ශන පැවැත්වීම<br>7. මල් වගාව හා උද්‍යාන භූමි අලංකරණය පිළිබඳ අත් පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම හා රූපවාහිනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>8. මල් වගාකරුවන් අතර මල්වගා ගොවි සමිති හරහා සංවිධාන ගත කිරීම.<br>9. රටෙහි මල්වගා කර්මාන්තය නගා සිටුවාලීම සඳහා මල්වගා ප්‍රවර්ධන වැඩසටහන් පවත්වාගෙන යාම.<br>10. කොළඹ විවිධ ස්ථානවල කැපූ මල් අලෙවි ස්ථාන ස්ථාපිත කිරීම.<br>11. ශාක වර්ගීකරණය සහ සංරක්ෂණය, ජෛව විවිධත්වය සහ අනෙකුත් ආශ්‍රිත අධ්‍යාපන/පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම. |
| විභවයක් ඇති විසිතුරු ශාක පිළිබඳව දිගුකාලීන හා කෙටි කාලීන පර්යේෂණ වැඩසටහන් ආරම්භ කිරීම. | 1. ක්ෂේත්‍රයේ නියැලෙන්නන් සමඟ එක්ව අළුත් වර්ග සහ විභවයක් ඇති වනමල් විශේෂ ගවේෂණය හා ක්ෂේත්‍රයට හඳුන්වා දීම.<br>2. ශෂ්‍ය විද්‍යාව සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම හා එම ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම.<br>3. මල්වගා බෝගවල පූර්ව සහ පසු අස්වනු කළමනාකරණය පිළිබඳ පර්යේෂණ.<br>4. ජෛව තාක්ෂණය සහ පටක රෝපණය පිළිබඳ පර්යේෂණ පවත්වාගෙන යාම.<br>5. මල්වගාමය විභවයක් ඇති ජලජ ශාකවල පර්යේෂණ පැවැත්වීම.<br>6. පලිබෝධ සහ රෝග පිළිබඳ පර්යේෂණ.<br>7. මල් ප්‍රේරණ ක්‍රමවේද පිළිබඳ පර්යේෂණ. |
| ජීවනෝපාය නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 1. මල් වගාව සහ භූමි අලංකරණය පිළිබඳ තරුණ තරුණියන් සඳහා ත්‍රෛමාසික, එක් අවුරුදු, දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන් ලබා දීම.<br>2. මල්වගාව, උද්‍යාන බෝග වගාව සහ ශාක සංරක්ෂණය පිළිබඳ උපදේශක සේවාවන් සැපයීම. |